# වාර්ෂික වාර්තාව - 2024

# ஆண்டறிக்கை - 2024

# ANNUAL REPORT – 2024

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

**தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை**

**National Child Protection Authority**

**කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය**

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு

Ministry of Women and Child Affairs

# වාර්ෂික වාර්තාව

# 2024

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# දැක්ම

ළමුන් සඳහා ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ගොඩනැගීම

# මෙහෙවර

ළමුන් සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් නිදහස් බව තහවුරු කිරීම

# 2024 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය

| අනු අංකය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් | තනතුරු නාමය සහ පත්වූ කාලය | සුදුසුකම් සහ විෂය ක්ෂේත්‍රය | වෙනත් මණ්ඩල හෝ කමිටුවල සාමාජිකත්වය | 2024 වසරේ සහභාගී වූ රැස්වීම් සංඛ්‍යාව | විධායක, විධායක නොවන සහ ස්වාධීන |
|---|---|---|---|---|---|---|
| 01 | ප්‍රීති ඉනෝකා රණසිංහ මෙනවිය | සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>(2024.10.08) | විශ්‍රාමික මහාධිකරණ විනිසුරු | - | 01 | විධායක |
| 02 | මහාචාර්ය ක්ලිෆර්ඩ් පෙරේරා මහතා | නියෝජ්‍ය සභාපති,<br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>(2024.11.28) | අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය, වෛද්‍ය පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය<br><br>MBBS, DLM , MD in Forensic Medicine,<br><br>MA, LLB, DMJPath (London),<br><br>MFFLM (UK), Atteorney - at-Law, FCFPSL | **Senior Student Counsellor -** University of Ruhuna,<br><br>**Chairman -** Board of Study in Forensic Medicine,Post graduate Institute of Medicine, University of Colombo,<br><br>**President -** Sri Lanka College of Legal Medicine, Treasurer, Indo Pacific Association for Law Medicine and Scinece,<br><br>**Member -** Post Crash Response squad, Ministry of Transport, Government of Sri Lanka. | 01 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 03 | වෛද්‍ය දර්ශනී බුද්දිකා හෙට්ටිආරච්චි මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2024.07.29) | විශේෂඥ වෛද්‍ය ළමා හා නව යොවුන් විය, රිජ්වේ ආර්යා ළමා රෝහල<br><br>MBBS (Colombo) 2005,<br><br>MD Psychiatry,<br><br>Board Certified Specialist Child and Adolescent Psychiatrist | **Chairperson -** Child and Adolescent subcommittee, Sri Lanka College of psychiatrists.<br><br>**Committee Member-** Technical Advisory committee on young persons health, Family health bureau, Ministry of Health,<br><br>**Committee Member -** National Steering committee on Child disabilities, Ministry of Health,<br><br>**Committee Member-** Ethical review committee lady ridgeway Hospitals for children,<br><br>**Autism streering committe -** Lady ridgeway Hospitals for children | 02 | විධායක නොවන |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 04 | වෛද්‍ය සේනක ගුණතිලක මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2020.01.22 - 2022.07.08) | ළමා රෝග විශේෂඥ වෛද්‍ය සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය<br><br>MD (Col), DCH (Col), MBBS (Col) | | 07 | විධායක නොවන |
| 05 | වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2022.07.28) | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය<br><br>MD ( USSR),<br><br>DCM,<br><br>MD for Medicine (SSL),<br><br>Dip FM-RCPA(AM),<br><br>MFFLM-RCP (UK),<br><br>FFCFM-RCPA | **Board Member -** National Authority on Protection of Victims of Crime and Witness,<br><br>**Board Member -** National Anti Human Traffiking Task Force,<br><br>**Board Member -** office on missing person. | 07 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 06 | ආචාර්ය පවිත්‍රා ගොඩමුන්නේ මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2021.02.17 - 2022.07.28) | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය පීඨය, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය<br><br>BSc (Hons) Psychology (East London)<br><br>MA Psychology (Delhi)<br>PhD (Kelaniya) | | 07 | |
| 07 | මෛත්‍රී අමරසිංහ ජයතිලක මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2024.07.29) | ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ, නීතිපති දෙපාර්තමේන්තුව<br><br>LLM ( university of Warwick U.K)<br><br>H.R and Int. Development Law | | 03 | විධායක නොවන |
| 08 | රේණුකා ජයසුන්දර මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2024.07.29) | නියෝජ්‍ය පොලිස්පති, (ළමා හා කාන්තා කටයුතු) පොලිස් දෙපාර්තමේන්තුව<br><br>Master of Public Management. (SLIDA) | Joint Secretary at Medico Legal Society<br><br>සිරකරුවන් නිවාඩු යැවීම, බලපත්‍ර මත මුදවා ගැනීමේ කමිටු සාමාජික | 03 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 09 | ගයනි කෞශල්‍යා මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2023.01.24 2024.02.22) | කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල<br><br>B.sc. (Business Administration)<br><br>M.A (Sociology) | | 07 | විධායක නොවන |
| 10 | එච්.කේ.කේ.ඒ. ජයසුන්දර මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2024.04.04) | කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු දෙපාර්තමේන්තුව , කොළඹ 06<br><br>Bachelor of Arts (Political Science - Special) University of Colombo -1996<br><br>Master of Development Policy KDI school of Public Policy and Management Korea - 2016<br><br>Attorney At Law - Supreme Court of Sri Lanka - 2009 | **Board Member:** Sri Lanka Vocational Training Authority<br><br>HDFC Bank and Sirama Vasana Fund<br><br>**Vice Chairman in Governing Council:** National Institute of Labour Studies & National Institute of Occupational Safety and health | 04 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | එම්.එච්.ජී.බණ්ඩාර මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික,(ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 40 වන වගන්තිය මගින් ඒ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කර්යය සඳහා සංස්ථාපනය කරනු ලැබූ කමිටුවේ සභාපතිවරයා නියෝජනය කිරීම) (2020.01.22) | අතිරේක ලේකම් (පාලන) කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, බත්තරමුල්ල<br><br>ආර්ථික විද්‍යාව විශේෂ වේදී උපාධිය (කොළඹ විශ්ව විද්‍යාලය), ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (මලය විශ්ව විද්‍යාලය, මැලේසියාව) | | 06 | විධායක නොවන |
| 12 | වෛද්‍ය එම්.යූ. කුමාරි ගල්හේන මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2024.07.29) | විශේෂඥ වෛද්‍ය පවුල් වෛද්‍ය විද්‍යා,<br><br>මූලික රෝහල පානදුර<br><br>MBBS (Peradeniya), MD (Family Medicine),<br><br>DFM, MRCGP (Int) | **Board Member -** Post gradute Institute of Medicine- University Colombo | 02 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | එච්.එම්. තිලකරත්න මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2024.07.29) | සම්බන්ධීකරණ ලේකම්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය<br><br>BSc University of Ruhuna,<br><br>MSSC University of Kelaniya | | 02 | විධායක නොවන |
| 14 | මිලානි සල්පිටිකෝරල මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික (2024.07.29) | ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ | | 01 | |

## 2024 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූල මණ්ඩලය

| අනු අංකය | මූල මණ්ඩල සාමාජිකයන්ගේ නම් | තනතුරු නාමය සහ පත්වූ කාලය | රාජකාරි කරන ස්ථානයේ ලිපිනය |
|---|---|---|---|
| 01 | ඒ.එම්.ඩී. සුමනසේන මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2020.05.26) | කොමසාරිස්, ළමා හා කාන්තා අංශය, කම්කරු දෙපාර්තමේන්තුව,කොළඹ 06 |
| 02 | වෛද්‍ය එච්.එස්.ආර්.පෙරේරා මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2020.06.19) | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, කොළඹ 10 |
| 03 | කේ.පි.එන්.දේවප්‍රිය මහතා | මූල මණ්ඩල සාමාජික (2020.06.11) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන), අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල |
| 04 | රෝෂිණී හෙට්ටිගේ මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2020.06.09) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (නීති), අධිකරණ අමාත්‍යාංශය, කොළඹ 12 |
| 05 | එම්.සී.එස්. දේවසුරේන්ද්‍ර මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2020.05.26) | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), තොරතුරු තාක්ෂණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, පොල්හේන්ගොඩ, කොළඹ 05 |
| 06 | වී.සී.ද සිල්වා මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2021.01.22) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, යුනියන් පෙදෙස, කොළඹ 02 |
| 07 | වෛද්‍ය ලාල් පනාපිටිය මහතා | මූල මණ්ඩල සාමාජික (2021.03.17) | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, කොළඹ 10 |
| 08 | හසිනි පල්ලාවල මහත්මිය | මූල මණ්ඩල සාමාජික (2020.05.20) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන), ආරක්ෂක අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ |
| 09 | එම්.ඩී.ජේ.සී.මුරගේ මහතා | මූල මණ්ඩල සාමාජික (2022.10.13) | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවාහන හා පාර්ලිමේන්තු කටයුතු), අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල |

# පටුන


| අන්තර්ගතය | පිටු සංඛ්‍යාව |
|---|---|
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමියගේ සමාලෝචනය | 1 - 1 |
| හැඳින්වීම | 2 - 3 |
| ප්‍රධාන කාර්යය | 3 - 4 |
| 2024 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන සටහන | 4 - 4 |
| 2024 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය | 5 - 5 |
| 2024 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු | 5 - 7 |
| මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධන විශ්ලේෂණය | 7 - 7 |
| **ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2024** | |
| ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධ උද්දේශනය සහ දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 8 - 09 |
| ළමා අපචාර වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන හඳුනා ගැනීම සඳහා නීති අංශය විසින් ආරම්භ කරන ලද කමිටු | 09 - 10 |
| ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම | 12 - 12 |
| ජාතික දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම | 12 - 12 |
| 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය | 12 - 13 |
| ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි | 13 - 17 |
| පාසල් ළමා ආරක්ෂක කමිටු හෙවත් "සුරැකුම් පව්ව" පිහිටුවීම සහ පාසල් ළමා ආරක්ෂක කමිටු සක්‍රීය කිරීම | 17 - 18 |
| ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා වන ළමා ආරක්ෂාව පිළිබඳ "ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහන | 18 - 20 |
| විශ්ව විද්‍යාල සිසුන් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ "විශ්ව විද්‍යාල ශිෂ්‍ය තානාපති " ජාතික වැඩසටහන | 20 - 21 |
| හදිසි ආපදා අවස්ථාවලදී ළමා ආරක්ෂණය සහ ළමුන් සඳහා හදිසි සහන වැඩසටහන | 21 - 21 |
| වින්දිත, ආන්තික,අනාරක්ෂිත, අවදානම්, ඇස නොගැටෙන ළමුන් සහ ළමා අපයෝජනවලට ලක් වූ ළමුන් සඳහා අධ්‍යාපනික ආධාර ලබාදීම | 21 - 21 |
| ළමා රැකවරණ සේවා සපයන ආගමික හා පුන්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය | 21 - 22 |
| ළමා ආරක්ෂාව පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 23 - 23 |
| ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන | 23 - 24 |
| ළමා ආරක්ෂාව පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු විද්‍යාලවල හෙද නිලධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන | 24 - 25 |
| ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය ව්‍යාපාර, තොරතුරු, අධ්‍යාපන හා සන්නිවේදන මෙවලම් සංවර්ධනය, උත්සව සහ දින සැමරුම්, ප්‍රදර්ශන සහ ජංගම සේවා, NCPA නිල වෙබ් අඩවිය, මුහුණු පොත, YouTube සහ twitter පවත්වාගෙන යාම සම්බන්ධ සන්නිවේදන වැඩසටහන් | 25 - 26 |
| විශේෂ විමර්ශන, විමර්ශන නියාමනය, අපරාධ නඩු විධානයන් පිළිබඳ නිරීක්ෂණයන්, ළමා අපචාර සහ අධිකරණ ක්‍රියාදාමයන් සම්බන්ධ සයිබර් සුපරීක්ෂණ | 26 - 26 |
| ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝනය වූ ළමුන් සඳහා සහාය වීම | 27 - 27 |

| | |
|---|---|
| ජාතික ළමා කේන්ද්‍රීය මනෝ සමාජීය සහය සේවය | 27 - 28 |
| ළමා අපයෝජන ප්‍රතිසාධන විෂයමාලාව | 28 - 28 |
| වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව වෙසෙන ළමුන්ගේ යහපැවැත්ම සහතික කිරීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ ප්‍රජා වැඩසටහන | 29 - 29 |
| වෙරළබඩ කලාපය ආශ්‍රිත ගම්මානවල ජීවත්වන ළමුන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම නඟා සිටුවීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන ප්‍රජාපාදක වැඩසටහන | 29 - 30 |
| නවාතැන් පහසුකම් සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන | 30 - 30 |
| ග්‍රාමීය මට්ටමේ ළමුන්ගේ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම උදෙසා ප්‍රජා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ දීපව්‍යාප්ත වැඩසටහන ("අපේ ළමුන්ට වඩා සුරක්ෂිත ගමක්") | 30 - 31 |
| පාසල් ළමුන් ප්‍රවාහනය කරන රියදුරන් හා සහායකයින් ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන | 31 - 31 |
| විශේෂ පොලිස් විමර්ශන | 32 - 32 |
| වාර්ෂික ගිණුම් | 33 - 51 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 52 - 62 |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිතුමියගේ සමාලෝචනය

ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූ ළමයින් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිණිස ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කාර්යය සඳහා සහ සියලු ආකාරයේ වූ ළමා අපයෝජනවලට එරෙහි වූ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය හා නියාමනය කිරීම සඳහා 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවන ලදී.

මෙම වසරේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම මෙන්ම ළමා අපායෝජන වළක්වා ගැනීම සඳහා ප්‍රජා දැනුවත් කිරීම පුළුල්ව සිදුකිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව 2024 වර්ෂයේදී ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. එම ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරන ලදී.

අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 2011/17 දරන 20211 මැයි මස 10වන දින නිකුත් කරන ලද පාසල් ළමා ආරක්ෂක චක්‍රලේඛය පදනම් කරගනිමින් ක්‍රියාත්මක කරන **"සුරැකුම් පච්ච"** ජාතික වැඩසටහනේ ඉදිරි පියවරක් ලෙස පාසල් ළමා ආරක්ෂක කමිටු ඇගයීමේ ජාතික වැඩසටහන අවසන් කරන ලදී. ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් "ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහන මෙම වසරේදීත් සිදුකරන ලදී. විශ්වවිද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම සඳහා "විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහනද ක්‍රියාත්මක කිරීම ද සිදුකරන ලදී.

දීප ව්‍යාප්තව ඇති ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝසාමාජීය නිලධාරීන් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් විසින් පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. වින්දිත ළමයාගේ උපරිම යහපත සාක්ෂාත් කර ගැනීමේ අරමුණ බලාත්මක කරමින් ළමා අපයෝජන හා සම්බන්ධ සියලු අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම සිදුකිරීමට කටයුතු කර ඇත. ළමා අපයෝජන සඳහා වරදකරුවන් වන තැනැත්තන් ළමයින් සමඟ කටයුතු කිරීම වලක්වාලීම සඳහා වන ක්‍රියා පටිපාටි හඳුන්වා දීමේ කටයුතුද සිදුකරන ලදී.

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතභාවයට පත් වන ළමුන් ද්විතීක වින්දිතභාවයට පත්වීම වැළැක්වීම සඳහා ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය මඟින් ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සිදුකරන ලදී. වින්දිතභාවයට පත් වූ ළමුන් මනෝසමාජීයව ප්‍රතිසාධනය කර ඔවුන්ගේ කුසලතා සංවර්ධනය කිරීම හා ඔවුන් නැවත අපයෝජනය වීම වැළැක්වීම සඳහා විධිමත් ලෙස, වින්දිතයන් හට මනෝසමාජීය සහාය ලබාදීම වෙනුවෙන් චිකිත්සක ආදර්ශයක් ලෙස ළමා අපයෝජන ප්‍රතිසාධන විෂය මාලාව (Child Abuse Recovery Curriculum) සකස් කර අවසන් කරන ලදී.

2024 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08ක් පවත්වන ලදී. සමස්තයක් වශයෙන් ගත් කළ 2024 වර්ෂය තුළ ද ළමා ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කළ සෑම අංශයකින්ම සැලකිය යුතු කාර්ය සාධනයක් අත්කර ගැනීමට හැකි වූ බව සඳහන් කළ හැකිය. මේ සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයෙන්, රේඛීය අමාත්‍යාංශයෙන්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගය අගය කරමි.

ප්‍රීති ඉනෝකා රණසිංහ
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## හැඳින්වීම

වර්ෂ 1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, විශ්ව ප්‍රකාශනයක් ලෙස සම්මත කර ගන්නා ලදී. මෙම සම්මුතිය වගන්ති 54කින් සමන්විත වන අතර, එමගින් ලොව සෑම ළමයෙකුටම හිමිවිය යුතු අයිතිවාසිකම් මෙන්ම එම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමෙහිලා රාජ්‍ය සතු වගකීම ද විග්‍රහ කර තිබේ. ළමා අයිතිවාසිකම් සම්මුතිය සම්මත කර ගැනීමෙන් පසුව එම කාලය තුළ පැවති සමාජ තත්ත්වය ගැන අවධානය යොමු කිරීමේ දී, ළමා වෙළඳාම, ළමා ගණිකා වෘත්තිය, ළමුන් කාමුක චිත්‍රපට සහ ප්‍රකාශන සඳහා යොදා ගැනීම සහ ජාත්‍යන්තර වශයෙන් රහසිගතව සිදු කරන ළමා වෙළඳාම ඉහළ යාම සම්බන්ධයෙන් දැඩි ලෙස සැලකිලිමත් වීම සිදු කරන ලදී. එමෙන්ම ආයුධ සන්නද්ධ අරගලයන් හි දී ළමයින් බලහත්කාරයෙන් යුධ සේවාවෙහි යෙදවීම හෝ බඳවා ගැනීම අන්තර් ජාතික අපරාධයක් ලෙස දැක්වීම ද හඳුනාගන්නා ලදී. මෙම කරුණු සියල්ල කෙරෙහි ම දැඩි ලෙස අවධානය යොමු කරමින් වර්ෂ 2000දී ළමා අයිතිවාසිකම් සම්මුතිය සඳහා ළමුන් සන්නද්ධ අරගලවලට බඳවා ගැනීම වැළැක්වීම සහ ළමා වෙළඳාම, ගණිකා වෘත්තිය සහ ළමයින් කාමුක චිත්‍රපට සඳහා යොදා ගැනීම වැළැක්වීම සම්බන්ධයෙන් අතුරු කෙටුම්පත් ඇතුළත් කරන ලදී.

ශ්‍රී ලංකා රජය ද එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා 1990 වසරේදී අත්සන් කොට තම එකඟතාවය පළ කරන ලදී. 1991 ජූලි 12 වන දින මෙම සම්මුතිය අනුමත විය. ඒ අනුව, ශ්‍රී ලංකාව තුළ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සම්බන්ධයෙන් 1996 වසරේ දෙසැම්බර් මස ළමා ආරක්ෂාව පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායක් පිහිටුවනු ලැබීය. එහි දී කරුණු විමර්ශනය කළ එම කමිටුව ළමා අපයෝජන අවම කිරීම සඳහා අධිකාරි බලතල සහිත රාජ්‍ය ආයතනයක අවශ්‍යතාවය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ඒ අනුව 1998 අගෝස්තු මාසයේදී අධිකරණ ඇමති විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. 1998 නොවැම්බර් මාසයේදී මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේදී ඒකමතිකව සම්මත විය. ඒ අනුව 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත මඟින් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපිත කරනු ලැබීය. 1999 ජූනි මාසයේදී අධිකාරියේ ප්‍රථම සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමෙන් පසුව අධිකාරිය ක්‍රියාත්මක විය. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආරම්භයේ සිට වර්තමානය දක්වාම ළමා අපයෝජන වළක්වා ගැනීම, ප්‍රතිචාර දැක්වීම, ළමා අපයෝජනයන් හි දී ඊට අදාළ නිසි පියවර ගැනීම හා වින්දිත ළමුන් යළි සමාජගත කිරීමට අදාළ කටයුතු වෙනුවෙන් ක්‍රියා කරමින් සිටියි.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන අතර, 2004 දෙසැම්බර් මස 26 වැනි දින ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් වින්දිතභාවයට පත් ළමුන්ගේ අභිවෘද්ධිය සඳහා 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත මඟින්ද අධිකාරිය වෙත බලතල හිමිව පවතියි. තවද 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මඟින් ළමයෙකු ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වූ විට අධිකාරියට වාර්තා වීමේදී තෙවන පාර්ශවකරුවෙකු වශයෙන් ඊට මැදිහත් වීම සිදුකළ හැකිය.

ළමයින්ගේ උපරිම යහපත වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා ළමා අපයෝජන සිදුවීම් කඩිනමව සහ විධිමත්ව වාර්තා කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2010 ජූලි 22 වන දින 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය පැය 24 පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරි පරිශ්‍රය තුළ ස්ථාපිත කරන ලදී. මෙම දුරකථන සේවය ආරම්භයත් සමඟ සමාජයේ සැඟව පැවති ළමා අපයෝජන සිද්ධි වාර්තා වීම ක්‍රම ක්‍රමයෙන් ඉහළ අගයක් ගැනීම දක්නට ලැබුණි. අද වන විට ලංකාවේ

සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ළමා අපයෝජන පිළිබඳ තොරතුරු සහ සිදුවීම් මෙම සේවය හරහා වාර්තා වන අතර, ළමුන් සඳහා උපදේශන සේවාවන් ද මෙමඟින් ලබාගත හැකිය.

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මූලික කාර්යයක් වන "ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" (National Policy on Child Protection) සඳහා 2019.10.29 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. එසේම මේ වන විට එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව "ළමා ආරක්ෂණය පිළිබඳ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම" පිළියෙල කිරීමේ කටයුතු අධිකාරිය විසින් සිදුකරයි.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ළමා ආරක්ෂාව වෙනුවෙන් 2024 වසර තුළදීත් ජාතික ක්‍රියාකාරී සැලසුම්වලට අදාළ කාර්යයන් සිදුකර ඇත.

## ප්‍රධාන කාර්යයන්

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතට අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පුළුල් කාර්යභාරයක් පැවරී ඇත. එම කාර්යභාරය පහත සඳහන් කර ඇත. (වගන්ති 14 ප්‍රකාරව)

(අ) ළමා අපයෝජන වැළැක්වීම සහ එවැනි අපයෝජනවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමෙහිලා රජයට උපදෙස් දීම.

(ආ) ළමා අපයෝජන වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම.

(ඇ) එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව රජයට උපදෙස් දීම.

(ඈ) අපයෝජනවලින් ආරක්ෂා කරනු ලැබීමට ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳ සහ ළමා අපයෝජන වැළැක්වීමේ ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම.

(ඉ) ළමා අපයෝජන වැළැක්වීමේ කාර්යය සඳහා සහ එවැනි අපයෝජනවලට ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අයිතීන් රැකගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීම සහ උචිත අවස්ථාවලදී එම කාර්යය සඳහා අදාළ අමාත්‍යාංශවල, පළාත් සභාවල, පළාත් පාලන ආයතනවල, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහ රජයේ හා පෞද්ගලික අංශයේ සංවිධානවල උපදෙස් විමසීම.

(ඊ) ළමා අපයෝජන වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන නිර්දේශ කිරීම.

(උ) සියලු ආකාර ළමා අපයෝජනවලට අදාළ නීති ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.

(ඌ) ළමා අපයෝජන හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.

(එ) සන්නද්ධ ගැටුම්වල බලපෑම්වලට පාත්‍ර වූ ළමයින් සම්බන්ධව මානුෂිකව සැලකිල්ලට ගතයුතු කරුණු පිළිබඳව යොමුවීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම හා ඔවුන්ගේ මානසික හා ශාරීරික සුබසිද්ධිය සඳහා පියවර ගැනීම ඇතුළුව එවැනි ළමුන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සමාජයට නැවත ඇතුළු කර ගැනීම.

(ඒ) අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා, අවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම.

(ඔ) ළමා අපයෝජන පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම.

(ඕ) ළමා අපයෝජනවලට එරෙහිව කරනු ලබන දැඩි ව්‍යාපාර සම්බන්ධීකරණය සම්බන්ධයෙන් පළාත් සභාවලට, පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නොවන සංවිධානවලට උපදෙස් දීම හා සහාය වීම.

(ක) ළමා අපයෝජන සම්බන්ධව ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ එය පවත්වාගෙන යාම.

(ග) අදාළ අමාත්‍යාංශ හා වෙනත් ආයතනයන්ගේ උපදෙස් විමසා ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියලු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය කිරීම හා ඒ පිළිබඳව නියාමනය කිරීම.

(ච) ළමා අපයෝජන සහ ළමයින් ආරක්ෂා කිරීම හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම.


(ජ) ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමුන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම.

(ට) ළමා අපයෝජනවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම පිණිස, සංචාරක කටයුතු හා සම්බන්ධ සියලු අංශ සමඟ සංවාදයෙහි යෙදීම.

(ඩ) ළමා අපයෝජන පිළිබඳ වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම.

(ණ) සියලු ආකාර ළමා අපයෝජන අනාවරණය කර ගැනීම හා වැළැක්වීම හා සම්බන්ධයෙන් විදේශ රජයන් සහ අන්තර් ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම සහ තොරතුරු හුවමාරු කර ගැනීම.

**2024 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන සටහන**



## 2024 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සංවිධාන ව්‍යුහය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පහත සඳහන් අංශ ක්‍රියාත්මක වේ.

1. සභාපති හා නියෝජ්‍ය සභාපති කාර්යාලය
2. අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
3. පරිපාලන හා මානව සම්පත් අංශය
4. මූල්‍ය අංශය
5 .සැලසුම් හා තොරතුරු අංශය
    5.1 සැලසුම් හා නියාමන ඒකකය
    5.2 තොරතුරු හා මාධ්‍ය ඒකකය
        - පුස්තකාලය
6. පර්යේෂණ හා සංවර්ධන අංශය
7. මනෝසමාජීය අංශය
8. නීති අංශය
9 .නීතිය බලාත්මක කිරීමේ අංශය
    9.1 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය
    9.2 මධ්‍යම ලේඛනාගාරය
    9.3 වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය
        9.3.1 වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය - රාගම
    9.4 අන්තර්ජාල ආවේක්ෂණ ඒකකය
    9.5 විමර්ශන ඒකකය
10. අභ්‍යන්තර විගණන අංශය
11. විශේෂ පොලිස් විමර්ශන ඒකකය

## 2024 වසරේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය සහ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු

| අංකය | තනතුර | වැටුප් - කේත අංකය | අනුමත සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් (කොන්ත්‍රාත් පදනම මත) | HM -2-1 | 01 | 01 | - |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | HM -1-3 | 01 | - | 01 |
| 03 | අධ්‍යක්ෂ - පරිපාලන හා මානව සම්පත් | HM -1-1 | 01 | - | 01 |
| 04 | අධ්‍යක්ෂ - මූල්‍ය | HM -1-1 | 01 | - | 01 |
| 05 | අධ්‍යක්ෂ - නීති | HM -1-1 | 01 | 01 | - |
| 06 | සායනික මනෝවිද්‍යාඥ | HM -1-1 | 01 | - | 01 |
| 07 | අධ්‍යක්ෂ - සැලසුම් හා තොරතුරු | HM -1-1 | 01 | 01 | - |
| 08 | අධ්‍යක්ෂ - වැඩසටහන් | HM -1-1 | 01 | 01 | - |
| 09 | අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම | HM -1-1 | 01 | 01 | - |
| 10 | සහකාර අධ්‍යක්ෂ - පරිපාලන | MM -1-1 | 01 | 01 | - |
| 11 | නීති නිලධාරී | MM -1-1 | 04 | 01 | 03 |
| 12 | සහකාර අධ්‍යක්ෂ - වැඩසටහන් | MM - 1-1 | 01 | 01 | - |


| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | සහකාර අධ්‍යක්ෂ - මනෝවිද්‍යා (අධ්‍යයන නිවාඩු) | MM -1-1 | 01 | 01 | - |
| 14 | සහකාර අධ්‍යක්ෂ - සැලසුම් හා නියාමන | MM -1-1 | 01 | 01 | - |
| 15 | සහකාර අධ්‍යක්ෂ - මාධ්‍ය හා තොරතුරු | MM -1-1 | 01 | 01 | - |
| 16 | සහකාර අධ්‍යක්ෂ - නීතිය බලාත්මක කිරීම | MM -1-1 | 01 | - | 01 |
| 17 | ගණකාධිකාරී | MM -1-1 | 01 | 01 | - |
| 18 | අභ්‍යන්තර විගණක | MM -1-1 | 01 | 01 | - |
| 19 | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | JM – 1-1 | 01 | - | 01 |
| 20 | පරිපාලන නිලධාරි | JM – 1-1 | 01 | - | 01 |
| 21 | වැඩසටහන් නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 22 | ගිණුම් නිලධාරි | JM – 1-1 | 01 | - | 01 |
| 23 | විමර්ශන නිලධාරි | JM – 1-1 | 02 | 01 | 01 |
| 24 | මාධ්‍ය හා තොරතුරු නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 25 | සැලසුම් හා නියාමන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 26 | පර්යේෂණ හා සුබසාධන නිලධාරි | JM – 1-1 | 01 | 01 | - |
| 27 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ නිලධාරී | JM – 1-1 | 01 | 01 | - |
| 28 | මනෝසමාජීය නිලධාරී | JM – 1-1 | 01 | - | 01 |
| 29 | සයිබර් අපරාධ විශ්ලේෂක | JM – 1-1 | 01 | - | 01 |
| 30 | සයිබර් විමර්ශන නිලධාරී | JM – 1-1 | 01 | - | 01 |
| 31 | නීතිය බලාත්මක කිරීමේ නිලධාරි | JM – 1-1 | 01 | - | 01 |
| 32 | තොරතුරු තාක්ෂණ නිලධාරි | JM – 1-1 | 01 | - | 01 |
| 33 | පරිවර්තක - ඉංග්‍රීසි | MA - 4 | 01 | - | 01 |
| 34 | පරිවර්තක - දමිළ | MA - 4 | 01 | - | 01 |
| 35 | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 25 | 17 | 08 |
| 36 | දිස්ත්‍රික් මනෝසමාජීය නිලධාරි | MA - 3 | 25 | 14 | 11 |
| 37 | ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරි | MA - 3 | 369 | 209 | 160 |
| 38 | ළමා වින්දිත ආරක්ෂක නිලධාරි | MA - 3 | 01 | - | 01 |
| 39 | පරිපාලන සහකාර | MA - 3 | 01 | 01 | - |
| 40 | ගිණුම් සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 41 | මාධ්‍ය සහකාර | MA - 3 | 03 | - | 03 |
| 42 | පුස්තකාලයාධිපති | MA - 3 | 01 | - | 01 |
| 43 | සැලසුම් සහකාර | MA - 3 | 01 | - | 01 |
| 44 | විමර්ශන සහකාර | MA - 3 | 06 | 02 | 04 |
| 45 | උපදේශන සහකාර | MA - 3 | 15 | 04 | 11 |
| 46 | වැඩසටහන් සහකාර | MA - 3 | 03 | 01 | 02 |
| 47 | වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ සහකාර | MA - 3 | 10 | 01 | 09 |
| 48 | අන්තර්ජාල ආවේක්ෂණ සහකාර | MA - 3 | 02 | 01 | 01 |
| 49 | චිකිත්සක | MA - 3 | 03 | 01 | 02 |
| 50 | වීඩියෝ තාක්ෂණික සහකාර | MA – 2-1 | 10 | 02 | 08 |
| 51 | කළමණාකරන සහකාර (තාක්ෂණික) | MA – 2-1 | 15 | 06 | 09 |
| 52 | තොරතුරු තාක්ෂණික සහකාර | MA – 2-1 | 02 | 01 | 01 |
| 53 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) | MA – 1-1 | 32 | 12 | 20 |
| 54 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) යතුරුලියන කටයුතු (සිංහල මාධ්‍ය) | MA – 1-1 | 10 | - | 10 |
| 55 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) යතුරුලියන කටයුතු (දමිළ මාධ්‍ය) | MA – 1-1 | 10 | 01 | 09 |


| | | | | | |
|---|---|---|---|---|---|
| 56 | කළමණාකරන සහකාර - (තාක්ෂණික නොවන) සෝදුපත් බැලීමේ කටයුතු (සිංහල මාධ්‍ය) | MA – 1-1 | 10 | 02 | 08 |
| 57 | කළමණාකරන සහකාර (තාක්ෂණික නොවන) සෝදුපත් බැලීමේ කටයුතු (දමිළ මාධ්‍ය) | MA – 1-1 | 10 | - | 10 |
| 58 | රියදුරු | PL 3 | 07 | 04 | 03 |
| 59 | පණිවිඩකරු | PL-1 | 01 | - | 01 |
| 60 | කාර්යාල කාර්ය සහයක | PL-1 | 03 | 03 | - |
| 61 | කාර්යාල කම්කරු | PL-1 | 02 | 01 | 01 |
| **මුළු සංඛ්‍යාව** | | | **618** | **303** | **315** |

**මූලාශ්‍රය - පරිපාලන හා මානව සම්පත් අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## මූල්‍ය සහ මෙහෙයුම් කාර්යසාධන විශ්ලේෂණය

2024 වසරේ දී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය ජාතික සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම යටතේ ක්‍රියාත්මක විය. 2024 වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 40කි.



## ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් - 2024

### ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධ උද්දේශනය සහ දිස්ත්‍රික්, කොට්ඨාස මට්ටමින් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.

ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම මෙම වසරේදීත් සිදුකරන ලදී. මෙහිදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන පාර්ශවකරුවන් දහයක් (10) වන අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ, අධ්‍යාපන, ආරක්ෂාව සහ නීති බලාත්මක කිරීම, සෞඛ්‍ය, සමාජ අභිවෘද්ධිය, කම්කරු හා රැකීරක්ෂා, සංචාරක, ජනමාධ්‍ය හා තොරතුරු තාක්ෂණ, ළමා හා කාන්තා කටයුතු සහ ආපදා කළමණාකරනය සම්බන්ධ වෘත්තිකයන් සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් වැඩමුළු පැවැත්වීම සිදුකරන ලදී.

2024 වර්ෂයේදී සම්පත් සංචිතයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු 02ක් පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 73කි. වැඩසටහන් 28ක් සිදුකරන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,372කි.

තවද ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් විසින් ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රතිපාදන රහිතව සිදුකර ඇත. එම වැඩසටහන් 27ක් පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 689කි.

**ප්‍රතිපාදන සහිතව සිදුකරන ලද වැඩසටහන් පහත සඳහන් කර ඇත.**


| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කොළඹ | 01 | 40 |
| 02 | ගම්පහ | 01 | 45 |
| 03 | කළුතර | 01 | 48 |
| 04 | ගාල්ල | 01 | 45 |
| 05 | මාතර | 01 | 51 |
| 06 | හම්බන්තොට | 01 | 40 |
| 07 | බදුල්ල | 01 | 49 |
| 08 | මොණරාගල | 01 | 52 |
| 09 | ත්‍රිකුණාමළය | 02 | 114 |
| 10 | මඩකලපුව | 01 | 53 |
| 11 | අම්පාර | 02 | 98 |
| 12 | පුත්තලම | 01 | 45 |
| 13 | කුරුණෑගල | 01 | 57 |
| 14 | මහනුවර | 01 | 57 |
| 15 | මාතලේ | 01 | 50 |
| 16 | නුවරඑළිය | 01 | 47 |
| 17 | අනුරාධපුරය | 01 | 47 |
| 18 | පොළොන්නරුව | 01 | 44 |
| 19 | කෑගල්ල | 01 | 55 |
| 20 | රත්නපුරය | 01 | 45 |
| 21 | යාපනය | 02 | 110 |
| 22 | කිලිනොච්චිය | 01 | 40 |
| 23 | මුලතිව් | 01 | 50 |
| 24 | මන්නාරම | 01 | 45 |
| 25 | වව්නියාව | 01 | 45 |
| **මුළු සංඛ්‍යාව** | | **28** | **1372** |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**


ප්‍රතිපාදන රහිතව සිදු කරන ලද වැඩසටහන් පහත සඳහන් කර ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ගම්පහ | 01 | 36 |
| 02 | කුරුණෑගල | 18 | 589 |
| 03 | මාතලේ | 01 | 27 |
| 04 | අනුරාධපුරය | 04 | 534 |
| 05 | කෑගල්ල | 02 | 86 |
| **මුළු සංඛ්‍යාව** | | **26** | **1272** |

**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**




**මූලාශ්‍රය - මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන අංශය**




**මූලාශ්‍රය - ගිණුම් අංශය**

## ළමා අපචාර වැළැක්වීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය හෝ වෙනත් සංශෝධන හඳුනා ගැනීම සඳහා නීති අංශය විසින් ආරම්භ කරන ලද කමිටු

### 1. 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත සංශෝධනය කිරීමේ කමිටුව

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ස්ථාපනය කරන ලද 1998 අංක 50 දරන පනත බලාත්මක කර වසර 25ක කාලයක් ගතව ඇත. මෙම වසර 25ක ගත වූ කාලය තුළ ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා නීතිමය වශයෙන් සිදුවූ වෙනස්වීම් හේතුවෙන් ඊට අනුරූපීව ළමා ආරක්ෂාව තහවුරු කිරීමට ගතයුතු ක්‍රියාමාර්ගයන්හි වෙනස්කම් සිදුවිය යුතු බව හඳුනා ගෙන ඇත. මේවන විට පනත සංශෝධනයට අදාළව යෝජනා රැස් කර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති අතර එම කෙටුම්පත සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට යොමුකර ඇත.

### 2. ළමා අපයෝජන සඳහා වරදකරුවන් වන තැනැත්තන් ළමයින් සමඟ කටයුතු කිරීම වළකාලීම සඳහා වන ක්‍රියා පටිපාටි හඳුන්වා දීමේ කමිටුව

ළමා අපයෝජන සම්බන්ධයෙන් වරදකරු වී ඇත්ද යන්න සම්බන්ධයෙන් පසුබිම් පරීක්ෂාවක් කරන්නේ නම් එමඟින් ළමා අපයෝජන සම්බන්ධයෙන් වරදකරුවන්වූ තැනැත්තන් ළමයින් සමඟ කටයුතු කිරීම වළක්වාලිය හැකි වේ. එමඟින් ළමයින් අපයෝජනයන්ට ගොදුරු වීමේ අවස්ථාවන් අවම කරගත හැකිවනු ඇත. මේ සම්බන්ධයෙන් නීතිමය හෝ පටිපාටිමය වශයෙන් සීමාවන් පැනවීමේ ප්‍රතිපාදන මෙතෙක් හඳුන්වා දී නැත. එහෙයින් මීට අදාළව ජාතික ළමා

ආරක්ෂක අධිකාරිය විසින් කමිටුවක් පත්කර එම කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ආරම්භයක් ලෙස ළමයින් සමඟ සෘජුව කටයුතු කරන රජයේ දෙපාර්තමේන්තුව සහ ආයතන 06ක් ආවරණය වන ලෙස මෙම විශේෂ විධිවිධාන බලාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ සඳහා වන නීතිමය පරීක්ෂාව සිදුකිරීම සඳහා අදාළ විශේෂ විධිවිධාන මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

### 3. ළමා අපයෝජන නඩු සඳහා ගත වන කාලය අඩු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ කමිටුව

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 232 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ගන්නා ලද තීරණය පරිදි ළමා අපයෝජන නඩු කටයුතු කඩිනම් කිරීම සම්බන්ධ පාර්ශවකරුවන් සමඟ සංවාදය සඳහා ක්‍රමවේදයක් සැකසීම සිදුකරන ලදී. ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වා ප්‍රමුඛතාවය ලබා දිය යුතු කරුණු හඳුනා ගන්නා ලදී. ඒ අනුව මේ වන විට පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ කොට්ඨාස කාර්යාල වෙතින් අවශ්‍ය තොරතුරු රැස් කරමින් පවතී.

### 4. සංචරණ හා සංචාරක ක්ෂේත්‍රය ළමා ආරක්ෂාව පිළිබඳ සංසදය

අධිකාරි පනතේ 14 (ට) වගන්තිය බලාත්මක කිරීම සඳහා ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන රජයේ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, සංචරණ හා සංචාරක ක්ෂේත්‍රයේ පෞද්ගලික ආයතන එකමුතුව පිහිටුවා ගන්නා ලද මෙම සංසදයේදී ළමා අපයෝජනවලට ඇති ඉඩ ප්‍රස්ථා අවම කිරීම සඳහා අවශ්‍ය වන සංවාදයකට මූලිකත්වය නීති අංශය විසින් ලබා දෙනු ලැබේ.

ඒ අනුව මෙම සංසදය ළමා වෙළඳාමට අදාළව සමාජ මාධ්‍ය, විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය හරහා දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කරන ලදී.







### 5. පොලිස් භාරයට ගෙන ඇති ළමයින් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ක්‍රමවේදයේ දුර්වලතා අධ්‍යයනය කොට වඩාත් ඵලදායී යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ කමිටුව.

මෙම කමිටුව කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව විසින් පත් කරන ලද්දක් වන අතර අධිකාරියේ නීති අංශයේ අධ්‍යක්ෂ මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන ලදී. මීට අදාළ අවසන් කමිටු වාර්තාව සකස්කර ඇත.

**ළමා අපයෝජන හා සම්බන්ධ සියලු අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය කිරීම.**

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනතේ, 14(ඍ) වගන්තිය ප්‍රකාරව ළමා අපයෝජන හා සම්බන්ධ සියලු විමර්ශන හා අපරාධ නඩු කටයුතුවල ප්‍රගතිය නියාමනය අධිකාරියේ කර්තව්‍යයකි. අධිකාරිය වෙත වාර්තා වන පැමිණිලි මත ගොනු වන ළමා අපයෝජන නඩු සම්බන්ධයෙන් නියාමන කටයුතු සිදුකෙරෙමින් පැවතුනි. එහෙත් දිවයිනම ආවරණය වන පරිදි සියලුම ළමා අපයෝජන නඩු කටයුතු නියාමනය කිරීම සඳහා වැඩපිළිවෙලක් හඳුන්වා දෙමින් එහි පළමු අදියර ලෙස ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පරිශ්‍රයේ පිහිටා ඇති විශේෂ පොලිස් විමර්ශන ඒකකය විසින් විමර්ශනය කර දිවයින පුරා පවත්වා ගෙන යන ළමා අපයෝජන නඩු කටයුතු නියාමනය කිරීම් ආරම්භ කර ඇත. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුව, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, අධිකරණ වෛද්‍ය නිලධාරීවරු සහ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යන ආයතන වෙතින් නඩු නියාමනයට අදාළව විමසීම් හා සම්බන්ධීකරණයන් සිදුකර ඇත.

**අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින්ගේ ආරක්ෂාව හා රැකවරණය සඳහා අවශ්‍ය අවස්ථාවලදී උචිත පියවර ගැනීම.**

ජනාධිපති කාර්යසාධන බලකායේ උපදෙස් මත, අධිකාරිය පනතේ 14 (ඒ) වගන්තිය යටතේ අපරාධ පිළිබඳ විමර්ශනවලට සහ අපරාධ නඩු කටයුතුවලට සම්බන්ධ ළමයින් අධිකරණ නියෝග මත රඳවා තැබෙන පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වා ගෙන යනු ලබන රැඳවුම් නිවාස හා සහතික කළ පාසල් නියාමනය සම්බන්ධයෙන් පළාත් 07ක් ආවරණය වන සේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී අදාළ දත්ත රැස් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදය යොදා ගන්නා ලදී. මෙම ආයතනගත ළමයින්ගේ නඩු කටයුතු සම්බන්ධයෙන් අදාළ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කොමසාරිස්වරුන්ගෙන් හා පොලිස් ස්ථාන වෙතින් අවශ්‍ය තොරතුරු කැඳවමින් නඩු කටයුතු නියාමනය ආරම්භ කර ඇත.

**අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම.**

2015 අංක 01 දරන ළමයින් අනිවාර්යයෙන් පාසල්වලට පැමිණීමේ නියෝග ලෙස හඳුන්වන අනිවාර්ය අධ්‍යාපන නියෝගය, 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 (උ) වගන්තිය යටතේ අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම නියාමනය කිරීම ආරම්භ කර ඇත.
බස්නාහිර පළාතේ අධ්‍යාපන අධ්‍යක්ෂ සමඟ මේ පිළිබඳව සාකච්ඡා පවත්වන ලද අතර පළාතේ අනිවාර්ය අධ්‍යාපන නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම ඇති නිලධාරීන් වෙනුවෙන් සැසියක් පවත්වන ලදී. අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි ආශ්‍රයෙන් මෙම අනිවාර්ය අධ්‍යාපන නියෝගය ක්‍රියාත්මක වීම සම්බන්ධ නියාමන කටයුතු සිදු වේ.

**නීතිමය ගැටලු සම්බන්ධයෙන් සහාය ලබා දීම්**

1) ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ඇතිවන නීතිමය ගැටලු සඳහා නීතිඥ උපදෙස් ලබාදීම සිදුකෙරේ. එම නීතිමය ගැටලු මාර්ගගතව, දුරකථනයෙන් හා අධිකාරිය වෙත පුද්ගලිකව පැමිණෙන තැනැත්තන් මාර්ගයෙන් ඉදිරිපත්වන අතර 2024 වර්ෂයේදී සිදුවීම් 803 ක් සඳහා සහාය ලබාදීම් සිදුකර ඇත.

2) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙනුවෙන් අධිකරණයන්හි, විනිශ්චය සභාවන්හි සහ කොමිෂන් සභාවන් ඉදිරියේ පැවැත්වෙන නීති කටයුතු සඳහා කැඳවීම් කෙරෙන ආකාරයට නීතිමය පෙනී සිටීම් සිදුකර ඇත.

## ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම.

ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශය සකස් කර අවසන් කරන ලදී. ඒ අනුව එය වඩාත් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම ද අවසන් කරන ලදී. සුරක්ෂිත, ළමා හිතකාමී පරිසරයක් තුළ ළමයින්ගේ සාකල්‍ය සංවර්ධනයට සහාය වන සහ රැකියාවල නියුතු දෙමාපියන්ට/පවුල්වලට තම ළමයින් සුරක්ෂිතව සිටින්නේය යන හැඟීම ලබාදෙන, සමාජ සාධාරණ හා මිල දැරිය හැකි උසස් තත්ත්වයේ රැකවරණයක් සපයා දීම පිණිස ළමා දිවා සුරැකුම් පහසුකම් පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ඒවා නියාමනය කිරීම ඉලක්ක කරගනිමින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සිදුකරනු ලබයි. මෙමඟින් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු කිහිපයකි. එනම් ,

1. රැකියාවල නියුතු දෙමාපියන්ගේ/පවුල්වල ළමයින් සඳහා මිල දැරිය හැකි ළමා දිවා සුරැකුම් පහසුකම්වලට සාධාරණ ප්‍රවේශය පුළුල් කිරීම.
2. ළමයින් තමන්ගේ උපරිම විභවය වෙත ළඟාවන බව සහතික කිරීම සඳහා උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් සේවා සැපයීම සඳහා පහසුකම් සැලසීම.
3. ආබාධ සහිත ළමයින් සඳහා උසස් තත්ත්වයේ ළමා දිවා සුරැකුම් පහසුකම් පුළුල් කිරීම.
4. ළමා දිවා රැකවරණ පහසුකම් කළමනාකරණයේ ඵලදායිතාව ඉහළ නැංවීම.
5. කාර්යක්ෂම පාලනය සහ වගවීම සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ කාර්ය රාමුවක් හඳුන්වා දීම.

ප්‍රතිපත්තියේ කෙටුම්පත් කටයුතු අවසන් කර 2024.08.05 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

## ජාතික දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 (ක) වගන්තිය ප්‍රකාරව ළමා අපයෝජනයන්ට අදාළ ජාතික දත්ත පදනමක් සකස් කිරීම සහ පවත්වාගෙන යාම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරයක් වේ. මේ අනුව මෙම දත්ත පද්ධතිය සකස් කිරීමට අවශ්‍ය මූලික කාර්යයන් සිදුකරමින් පවතී. අදියර 03කින් සිදුකිරීමට මූලික සැලසුම් සකස් කරන ලදී. ජාතික දත්ත පද්ධතිය සඳහා තොරතුරු තාක්ෂණ විද්වතුන්ගේ සහය ලබාගැනීම මෙන්ම බහුපාර්ශවීය ප්‍රවේශයන් මත ලැබෙන දත්ත ඇතුළත් කිරීම සිදුකළ යුතුව ඇත. මෙම දත්ත කළමණාකරන පද්ධතිය සකස් විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව පාර්ශවකරුවන් වන ටෙලිකොම් ආයතනය සමඟ සාකච්ඡා පැවැත්වීම සිදුවිය. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අභ්‍යන්තර භාවිතය සඳහා දත්ත පද්ධතියක් පවත්වාගෙන යනු ලබයි. 2024 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලි මෙහෙයවීම සඳහා ඇති දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සිදුකරන ලදී.

## 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය.

ළමා අපයෝජන සම්බන්ධ මහජන පැමිණිලි භාර ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ.1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ වගන්ති 14 (ඔ) ප්‍රකාරව ළමා අපයෝජන පිළිබඳව මහජන පැමිණිලි භාර ගැනීම සහ අවශ්‍ය අවස්ථාවලදී ඒ පැමිණිලි නිසි බලධාරීන් වෙත යොමු කිරීම. මෙමඟින් සිදුකරනු ලබයි. මේ මඟින් කායික, මානසික, ලිංගික අපයෝජන මෙන්ම නොසලකා හැරීම්වලට

අදාළ මහජන පැමිණිලි භාරගැනීම ද පැය 24 පුරාම සිදුකරයි. මෙම දුරකථන සේවය සිංහල, දමිළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ක්‍රියාත්මක වේ. 2024 වර්ෂයේදී 1929 ළමා උපකාරක දුරකථන සේවය වෙත පැමිණිලි 7,362 ක් ලැබී ඇත. 1929 ළමා උපකාරක දුරකථන සේවය වෙත ඇමතුම් 29,667ක් ලැබී ඇත.

## ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලැබෙන ආකාර කිහිපයකි. එම ක්‍රම පහත සඳහන් කර ඇත.

01. 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය හරහා ලැබෙන පැමිණිලි.

02. අධිකාරියට පැමිණ ඉදිරිපත් කරන පැමිණිලි.

03. ලිපි, ෆැක්ස්, ඊමේල් මඟින් ලැබෙන පැමිණිලි.

04. සයිබර් ආවේක්ෂණය මඟින් ලැබෙන තොරතුරු.

05. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් වෙත ලැබෙන පැමිණිලි.

06. ජනමාධ්‍ය හෝ සමාජ මාධ්‍ය මඟින් අනාවරණය වන ළමා අපයෝජන සිද්ධීන්.


මෙම ලැබෙන පැමිණිලි සියල්ලම සඳහා මූලික කටයුතු සිදුකරන අතර පැමිණිල්ලේ ස්වභාවය අනුව වර්ග කිරීමක් සිදුකරයි. 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ වගන්ති 40 ප්‍රකාරව පහත සඳහන් කරන ලද වැරදිවලට අමතරව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විෂයය පථයට අදාළ නොවන වැරදි මහජනතාව විසින් යොමු කරනු ලබයි.

40 (අ) දණ්ඩ නීති සංග්‍රහයේ 286අ, 288, 288අ, 288ආ, 308අ, 360අ, 360ආ, 360ඇ, 363, 364අ, 365, 365අ හෝ 365ආ වගන්තිවල කවර හෝ විධානයක්;

40 (ආ) ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයෙහි නියුක්ත කිරීමේ පනතේ කවර හෝ විධිවිධානයක්;

40 (ඇ) ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනතේ කවර හෝ විධිවිධානයක්;

2024 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබී ඇති සමස්ත පැමිණිලි ප්‍රමාණය 8,192කි.




මූලාශ්‍රය - මධ්‍යම ලේඛනාගාරය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය


## වරදේ ස්වභාවය අනුව ළමා අපයෝජන පැමිණිලි වර්ගීකරණය


| අනු අංකය | වරදේ ස්වභාවය | පැමිණිලි ප්‍රමාණය |
|---|---|---|
| 01 | ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය ප්‍රකාශන - 286 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 50 |
| 02 | තම පාලනය යටතේ පරිශ්‍රයක සිදුවන ළමා අපයෝජනයක් දැනුම් නොදීම - 286 (ඇ) දණ්ඩ නීති සංග්‍රහය | - |
| 03 | ළමයින් සිඟමනේ යෙදවීම - 288 දණ්ඩ නීති සංග්‍රහය | 229 |
| 04 | ලිංගික සංසර්ගය සඳහා කුට්ටනියෙකු වශයෙන් ක්‍රියාකිරීමට ළමයින් කුලියට ගැනීම හෝ සේවයේ යෙදවීම - 288 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 25 |
| 05 | සීමිත භාණ්ඩ ජාවාරම් කිරීමට ළමයින් කුලියට ගැනීම - 288 (ආ) දණ්ඩ නීති සංග්‍රහය | 10 |
| 06 | ළමයින් කෲරත්වයට භාජනය කිරීම - 308 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 1950 |
| 07 | තුවාල සිදු කිරීම - 310 දණ්ඩ නීති සංග්‍රහය | 203 |
| 08 | බරපතල තුවාල සිදු කිරීම - 311 දණ්ඩ නීති සංග්‍රහය | 225 |
| 09 | ලිංගික අතවර කිරීම - 345. දණ්ඩ නීති සංග්‍රහය | 580 |
| 10 | ශ්‍රී ලංකාවෙන් අපහරණය කිරීම - 351 දණ්ඩ නීති සංග්‍රහය | 01 |
| 11 | නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය - 352. දණ්ඩ නීති සංග්‍රහය | 166 |
| 12 | පැහැරගෙනයාම - 353 දණ්ඩ නීති සංග්‍රහය | 46 |


| | | |
|---|---|---|
| 13 | බරපතල තුවාල කිරීම සඳහා අපහරණය - 356 දණ්ඩ නීති සංග්‍රහය | 02 |
| 14 | ණය බැඳුම්කරය දාසභාවය හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම-358 (අ) දණ්ඩ නීති සංග්‍රහය | - |
| 15 | කුට්ටානියකු ලෙස ළමයින් යෙදවීම - 360 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 25 |
| 16 | ළමුන්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම- 360 (ආ) දණ්ඩ නීති සංග්‍රහය | 06 |
| 17 | ළමයින් වෙළඳාම් කිරීම - 360 (ඇ) දණ්ඩ නීති සංග්‍රහය | 24 |
| 18 | කුලවද්දා ගැනීමට අදාළ වැරදි -360(ඈ) දණ්ඩ නීති සංග්‍රහය | 01 |
| 19 | ලිංගික අපයෝජනය සඳහා ළමයෙකුට ඇවිටිලි කිරීම -360(ඉ) දණ්ඩ නීති සංග්‍රහය | 11 |
| 20 | ස්ත්‍රී දූෂණය - 363 දණ්ඩ නීති සංග්‍රහය | 42 |
| 21 | ව්‍යභිචාරය - 364 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 10 |
| 22 | අස්වාභාවික ලිංගික ක්‍රියා 365 (අ) දණ්ඩ නීති සංග්‍රහය | 06 |
| 23 | බරපතල ලිංගික අපයෝජනය - 365 (ආ) දණ්ඩ නීති සංග්‍රහය | 321 |
| 24 | අස්වාභාවික වැරදි - 365 දණ්ඩ නීති සංග්‍රහය | 01 |
| 25 | වැරදිවලට අදාළ පල කිරීම් 365 (ඇ) දණ්ඩ නීති සංග්‍රහය | 01 |
| 26 | ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනතේ 35, 71, 72, 76, 77 අදාළ වේ | 2882 |
| 27 | ළමා ශ්‍රමිකත්වය - 1956 අංක 47 දරන පනත | 165 |
| 28 | ගෘහස්ථ හිංසනය - 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත | 34 |
| 29 | ළමා වැරදිකරුවන් | 136 |
| 30 | අනිවාර්ය අධ්‍යාපනය - 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනත | 1628 |
| 31 | ගබ්සාව | 03 |
| 32 | සියදිවි නසා ගැනීමට තැත් කිරීම | 18 |
| 33 | ළමා විවාහ | 14 |
| 34 | අන්තර්ජාල හිංසනය (නිරුවත් ඡායාරූප භාවිතා කරමින් තර්ජනය කිරීම) | 151 |
| 35 | උපදේශනය හෝ මනෝසමාජ සහය අවශ්‍ය ළමයින් | 637 |
| 36 | ළමුන් සඳහා ප්‍රවේශය | 01 |
| 37 | මත්ද්‍රව්‍ය හේතුවෙන් සිදුවන අපචාර | 120 |
| 38 | මූල්‍යමය හා වෙනත් හේතූන් මත පාසල් යැවීමට නොහැකිවීම | 02 |
| 39 | වයස අවු 2 ට අඩු ළමයින් අතහැර මව විදේශගත වීම් | 11 |
| 40 | ළමයින්ගේ හැසිරීම සම්බන්ධ ගැටලු | 31 |
| 41 | ළමයින්ගේ ප්‍රචණ්ඩකාරී හැසිරීම සම්බන්ධ ගැටළු | 23 |
| 42 | මාර්ගගත අධ්‍යාපනය හා සම්බන්ධ ගැටළු | 01 |


| | | |
|---|---|---|
| 43 | අධ්‍යාපන ආධාර සඳහා වන ඉල්ලීම් | 09 |
| 44 | යොවුන්වියේ ගැබ් ගැනීම් | 53 |
| 45 | උප්පැන්න සහතික නොමැතිවීම | 39 |
| 46 | පාසල් යාම ප්‍රතික්ෂේප කිරීම | 13 |
| 47 | පොලිස් පහර දීම් හා අත්අඩංගුවට ගැනීම් | 11 |
| 48 | වෙනත් | 757 |
| | **මුළු සංඛ්‍යාව** | **10674** |

❖ **2024 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබී ඇති සමස්ත ළමා අපයෝජන පැමිණිලි සංඛ්‍යාව වන්නේ 8192කි. නමුත් වරදේ ස්වභාවය අනුව ළමා අපයෝජන පැමිණිලි වර්ගීකරණයට අනුව සමස්ත පැමිණිලි සංඛ්‍යාව වන්නේ 10674කි. මෙසේ දත්ත වෙනස් වීමට හේතුව වී ඇත්තේ එක් පැමිණිල්ලක් තුළ වරදවල් කිහිපයක් අන්තර්ගතවන බැවිණි.**




❖ ඉහත ප්‍රස්ථාරයෙන් ළමුන් 02 දෙනෙක් වයස අවුරුදු 19 ට වැඩි වශයෙන් දක්වා ඇත. එයට හේතු වන්නේ අවුරුදු 18ට අඩු වයස් කාලය තුළදී සිදු වූ ළමා අපයෝජනවලට අදාළව ලබාගත් පැමිණිලි හේතුවෙනි.

## 2024 වර්ෂයේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග


| අනු අංකය | යොමු කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | ගොනු අවසන් කළ පැමිණිලි සංඛ්‍යාව | අවසන් තීරණ ගැනීමට පවතින පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | 8192 | 3522 | 4669 |

## පාසල් ළමා ආරක්ෂක කමිටු හෙවත් "සුරකුම් පව්ව" පිහිටුවීම සහ පාසල් ළමා ආරක්ෂක කමිටු සක්‍රීය කිරීම.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව බලාත්මක කර ගන්නා ලද 2011/17 දරන පාසල් ළමා ආරක්ෂක චක්‍රලේඛය පදනම් කරගනිමින් පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවා නොමැති පාසල්වල නව පාසල් ළමා ආරකෂක කමිටු ස්ථාපිත කිරීමටත් ස්ථාපනය කරන ලද පාසල් ළමා ආරකෂක කමිටු ශක්තිමත් කිරීම තුළින් පාසල් තුළ ළමා හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීමට මෙම වැඩසටහනින් අපේක්ෂිතය. 2024 වර්ෂයේදී 908ක් තක්සේරු කරන ලදී. මෙම තක්සේරු වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ සකස් කරන ලද නිර්නායක මත පදනම්ව මාර්ගගතව ODK යෙදුම මඟින් සිදුකරන ලදී. අධ්‍යාපන බලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 23ක් පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1237කි. පිහිටුවන ලද නව පාසල් ළමා ආරක්ෂක කමිටු සංඛ්‍යාව 687කි. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 14,804කි. ශක්තිමත් කරන ලද පාසල් ළමා ආරක්ෂක කමිටු සංඛ්‍යාව 114කි. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 8,456කි.




**මූලාශ්‍රය - පර්යේෂණ හා සංවර්ධන අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**





**මූලාශ්‍රය - ගිණුම් අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**


## ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින් සඳහා වන ළමා ආරක්ෂාව පිළිබඳ“ශිෂ්‍ය තානාපති” ජාතික වැඩසටහන

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව, පාසල තුළ ළමා හිතකාමී සහ සුරක්ෂිත පරිසරයක් ඇතිකිරීම සඳහා ජ්‍යෙෂ්ඨ පාසල් ශිෂ්‍ය නායකයින්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම,කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. මෙමඟින් පාසල් තුළ ළමා අපයෝජන අවම කිරීම සඳහා ශිෂ්‍ය නායකයින්ගේ දායකත්වය ලබා ගැනීම එනම් ළමා සහභාගිත්වය තුළින් ළමා ආරක්ෂාව තහවුරු කිරීම මෙන්ම පාසල් ප්‍රජාව ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබාදීම මෙම වැඩසටහනෙන් සිදුකරයි. 2024 වර්ෂයේදී දිස්ත්‍රික් 25 නියෝජනය කරමින් පාසල් 201ක් ලියාපදිංචි වී ඇත. ශිෂ්‍ය නායක මණ්ඩල භාර ගුරුවරුන් සහ ශිෂ්‍ය තානාපතිවරුන් සහභාගීවූ ශිෂ්‍ය තානාපති දිස්ත්‍රික් පුහුණු වැඩසටහන් 22ක්

පවත්වන ලදී. ළමා ආරක්ෂාව පිළිබඳ දිස්ත්‍රික් ශිෂ්‍ය නායකයන් ලියාපදිංචි කිරීම සමුළු 21ක් දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී.




**මූලාශ්‍රය - තොරතුරු හා මාධ්‍ය ඒකකය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**




**මූලාශ්‍රය - ගිණුම් අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**





## විශ්වවිද්‍යාල සිසුන් සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ"විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපති" ජාතික වැඩසටහන

විශ්වවිද්‍යාල සිසුන්ගේ ළමා ආරක්ෂාව පිළිබඳ දැනුම,කුසලතා සහ ආකල්ප සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමග ඒකාබද්ධව රාජ්‍ය විශ්වවිද්‍යාල 17 නියෝජනය කරමින් විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපතිවරු ලෙස විශ්වවිද්‍යාල සිසුන් 1337ක් ලියාපදිංචිව ඇත.

2024 වර්ෂයේ ළමා ආරක්ෂාව පිළිබඳ ස්වෙච්ඡාවෙන් සේවය කිරීම සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍ය තානාපතිවරු දැනුවත් කිරීමේ වැඩසටහන් 12ක් පවත්වන ලදී. මෙහිදී යාපනය විශ්වවිද්‍යාලය, අග්නිදිග විශ්වවිද්‍යාලය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාල තුළ මූලික පුහුණු වැඩසහටහන් පැවැත්වූ අතර ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත විවිධ විශ්වවිද්‍යාල නියෝජනය කරමින් පැමිණි ශිෂ්‍ය කණ්ඩායම් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මෙම විශ්වවිද්‍යාල සිසුන් ස්වේච්ඡා පදනමින් ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පාසල් ශිෂ්‍ය තානාපති වැඩසටහන සමඟ සම්බන්ධ වෙමින් කටයුතු කරයි.

| අනු අංකය | විශ්වවිද්‍යාලය | ලියාපදිංචි වූ විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොළඹ විශ්වවිද්‍යාලය | 137 |
| 02 | කැලණිය විශ්වවිද්‍යාලය | 133 |
| 03 | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 142 |
| 04 | ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය | 03 |
| 05 | මොරටුව විශ්වවිද්‍යාලය | - |
| 06 | ගම්පහ වික්‍රමාරච්චි විශ්වවිද්‍යාලය | 58 |
| 07 | විවෘත විශ්වවිද්‍යාලය | 83 |
| 08 | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 153 |
| 09 | රුහුණු විශ්වවිද්‍යාලය | 23 |
| 10 | යාපනය විශ්වවිද්‍යාලය | 46 |
| 11 | වවුනියාව විශ්වවිද්‍යාලය | 05 |
| 12 | වයඹ විශ්වවිද්‍යාලය | 03 |

| | | |
|---|---|---|
| 13 | නැගෙනහිර විශ්වවිද්‍යාලය | 31 |
| 14 | අග්නිදිග විශ්වවිද්‍යාල | 27 |
| 15 | රජරට විශ්වවිද්‍යාලය | 46 |
| 16 | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 123 |
| 17 | සබරගමුව විශ්වවිද්‍යාලය | 04 |
| **මුළු සංඛ්‍යාව** | | **1337** |

**මූලාශ්‍රය - තොරතුරු හා මාධ්‍ය ඒකකය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**




## හදිසි හෝ ආපදා අවස්ථාවලදී ළමා ආරක්ෂණය සහ ළමුන් සඳහා හදිසි සහන වැඩසටහන.

හදිසි තත්ත්වයකදී හෝ ආපදා අවස්ථාවක් සඳහා මුහුණු දෙන ළමුන්ගේ ළමා ආරක්ෂාව හා යහපැවැත්ම තහවුරු කිරීම උදෙසා සුදුසු ළමා ආරක්ෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීම මෙහි මූලික අරමුණ වේ. එසේම ළමුන් සඳහා හදිසි සහන ලබාදීම මේ මඟින් සිදුකරයි. මේ සඳහා මුදල් ප්‍රතිපාදන යොමු කරනු ලබන්නේ දිස්ත්‍රික්කයක හදිසි ආපදා තත්ත්වයක් ඇති වූ අවස්ථාවකදී පමණි. 2024 වර්ෂයේදී වැඩසටහන් 10ක් සිදු කරන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 52කි.

## වින්දිත, ආන්තික, අනාරක්ෂිත අවදානම්, ඇස නොගැටෙන ළමුන් සහ ළමා අපයෝජනවලට ලක් වූ ළමුන් සඳහා අධ්‍යාපනික ආධාර ලබාදීම.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පැමිණිලි අංකයක් සහිතව වාර්තා වන පැමිණිලි තුළ හඳුනාගනු ලබන, අධ්‍යාපන ආධාර සඳහා නිර්දේශිත වින්දිත, ආන්තික, ආනාරක්ෂිත අපයෝජන අවදානමක් සහිත ළමුන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම සඳහා සහය ලබාදීම මෙහි මූලික අරමුණ වේ. එක් ළමයෙක් සඳහා රු. 6000ක උපරිමකට යටත්ව පාසල් අධ්‍යාපනය සඳහා අවශ්‍ය භාණ්ඩ සහ උපකරණ ලබාදීම සිදුකරන අතර මුදල් අධාර ලබාදීම සිදුනොකරයි. 2024 වර්ෂයේදී ළමුන් 385 දෙනෙකු සඳහා අධ්‍යාපනික ආධාර ලබාදෙන ලදී.

## ළමා රැකවරණ සේවා සපයන ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනතේ 14 (ග) වගන්තියට අනුව ළමුන් සඳහා ළමා රැකවරණ සේවා සපයන සියළු ආගමික හා පුණ්‍ය ආයතන අධීක්ෂණය හා නියාමනය කිරීම ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරා ඇත. ඒ යටතේ දීප ව්‍යාප්තව ඇති ස්වේච්ඡා ළමා සංවර්ධන

මධ්‍යස්ථාන අධීක්ෂණය හා නියාමනය කිරීම දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන්, දිස්ත්‍රික් මනෝසාමාජීය නිලධාරීන් සහ ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරීන් විසින් පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙයට අමතරව 2024 වර්ෂයේදී ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි ළමුන්, පාලන අධිකාරිය සහ කාර්ය මණ්ඩලය සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ විවිධ දැනුවත් කිරීමේ කුසලතා සංවර්ධන වැඩසටහන් 14ක් පවත්වා ඇත. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 696කි. 2024 වර්ෂයේදී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 301ක් අධීක්ෂණය සහ නියාමනය කරන ලදී. එම සංඛ්‍යා පහත පරිදිවේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | අධීක්ෂණය සහ නියාමනය කළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කොළඹ | 43 |
| 02 | ගම්පහ | 39 |
| 03 | කළුතර | 21 |
| 04 | ගාල්ල | 09 |
| 05 | මාතර | 05 |
| 06 | හම්බන්තොට | 03 |
| 07 | බදුල්ල | 07 |
| 08 | මොණරාගල | 04 |
| 09 | ත්‍රිකුණාමළය | 13 |
| 10 | මඩකලපුව | 29 |
| 11 | අම්පාර | 08 |
| 12 | පුත්තලම | 18 |
| 13 | කුරුණෑගල | 18 |
| 14 | මහනුවර | 15 |
| 15 | මාතලේ | 08 |
| 16 | නුවරඑළිය | 07 |
| 17 | අනුරාධපුරය | 05 |
| 18 | පොළොන්නරුව | 02 |
| 19 | කෑගල්ල | 06 |
| 20 | රත්නපුරය | 09 |
| 21 | යාපනය | 09 |
| 22 | කිලිනොච්චිය | 09 |
| 23 | මුලතිව් | 03 |
| 24 | මන්නාරම | 06 |
| 25 | වව්නියාව | 05 |
| **මුළු සංඛ්‍යාව** | | **301** |

**මූලාශ්‍රය - පර්යේෂණ සහ සංවර්ධන අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## ළමා ආරක්ෂාව පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ ඉගෙනුම ලබන වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන

ළමුන්ට සිදුවන අපයෝජන සම්බන්ධයෙන් මෙන්ම ඒවා වළක්වාගැනීම සම්බන්ධයෙන්ද විවිධ මැදිහත්වීම් සිදුකිරීමේදී වෛද්‍යවරුන් විසින් විශාල කාර්යයභාරයක් ඉටුකරනු ලබයි. එම කාර්යයභාරය වඩාත් ශක්තිමත් කිරීම උදෙසා වෛද්‍යවරුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප දියුණු කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මෙම වැඩසටහන සිදුකර ඇත. 2024 වර්ෂයේදී ළමා ආරක්ෂාව පිළිබඳව පශ්චාත් වෛද්‍ය උපාධි ආයතනයේ අධ්‍යාපනය ලබන වෛද්‍යවරුන් 30 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් පවත්වා ඇත.

## ළමා ආරක්ෂාව පිළිබඳව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සවිඥානික හා සංවේදී ගුරු ප්‍රජාවක් හා කාර්ය මණ්ඩලයක් ගොඩනැංවීම තුළින් ළමා හිතකාමී පාසලක අධ්‍යාපනය ලබන සුරක්ෂිත හා සතුටින් සිටින ළමා පරපුරක් බිහි කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. 2024 වර්ෂයේදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 08ක වැඩසටහන් 08ක් සිදුකර අවසන් කරන ලදී. එමගින් දැනුවත් කරන ලද මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2289කි.

| අනු අංකය | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය මහනුවර | 01 | 415 |
| 02 | හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ගම්පහ | 01 | 401 |
| 03 | අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය අම්පාර | 01 | 308 |
| 04 | ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය බදුල්ල | 01 | 185 |
| 05 | දර්ගා නගර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය කළුතර | 01 | 235 |
| 06 | සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය ගම්පහ | 01 | 160 |
| 07 | වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය - වවුනියාව | 01 | 289 |
| 08 | රුහුණ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨය - ගාල්ල | 01 | 296 |
| **මුළු සංඛ්‍යාව** | | **08** | **2289** |

**මූලාශ්‍රය - පර්යේෂණ සහ සංවර්ධන අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**





## ළමා ආරක්ෂාව පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු විදුහල්වල හෙද නිලධාරීන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් සංවේදී හෙද නිලධාරීන් පිරිසක් බිහි කිරීම තුළින් ළමුන් සම්බන්ධව සිදුකරන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලු මැදිහත්කරණයන් ළමුන්ගේ උපරිම යහපත පිණිස සිදුකිරීම මෙහි මූලික අරමුණ වේ. මෙම වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති හෙද පුහුණු විදුහල් ආශ්‍රිතව සිදුකර ඇත. 2024 වර්ෂයේදී වැඩසටහන් 11ක් සිදුකර අවසන් කරන ලදී. එමඟින් දැනුවත් කරන ලද මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2236කි.

| අනු අංකය | හෙද පුහුණු විදුහල | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | යාපනය | 01 | 78 |
| 02 | අනුරාධපුරය | 01 | 153 |
| 03 | හම්බන්තොට | 01 | 122 |
| 04 | කළුතර | 01 | 45 |
| 05 | මහනුවර | 01 | 395 |
| 06 | කුරුණෑගල | 01 | 382 |
| 07 | බදුල්ල | 01 | 200 |
| 08 | රත්නපුරය | 01 | 189 |
| 09 | මාතර | 01 | 82 |
| 10 | කොළඹ | 01 | 230 |
| 11 | ගම්පහ | 01 | 360 |
| මුළු සංඛ්‍යාව | | 11 | 2236 |

**මූලාශ්‍රය - පර්යේෂණ සහ සංවර්ධන අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

**ළමා ආරක්ෂාව පිළිබඳ මාධ්‍ය ව්‍යාපාර, තොරතුරු, අධ්‍යාපන හා සන්නිවේදන මෙවලම් සංවර්ධනය, උත්සව සහ දින සැමරුම්,ප්‍රදර්ශන සහ ජංගම සේවා, NCPA නිලවෙබ් අඩවිය,මුහුණු පොත, YouTube සහ twitter පවත්වාගෙන යාම සම්බන්ධ සන්නිවේදන වැඩසටහන්**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ කාර්යභාරය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා තොරතුරු, අධ්‍යාපන හා සන්නිවේදන මෙවලම් සංවර්ධනය කිරීම සහ ඒවා භාවිතා කරමින් ප්‍රජාව දැනුවත් කිරීම මෙහි මූලික අරමුණ වේ. මෙහිදී ළමා අපයෝජන සම්බන්ධයෙන් විශේෂ අවස්ථා සහ සිද්ධි සම්බන්ධයෙන් හා දින සැමරුම් ආදිය ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම, විවිධ ප්‍රකාශන, ළමා ආරක්ෂාවට අදාළ ප්‍රදර්ශන සහ ජංගම සේවා පැවැත්වීම, ළමා අපචාර, අපයෝජන සම්බන්ධව දෛනිකව පුවත්පත් වාර්තා නියාමනය කිරීම ජනමාධ්‍ය මඟින් සමාජය දැනුවත් කිරීම, දින සැමරුම් පැවැත්වීම, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවිය, මුහුණු පොත, YouTube, Twitter සහ Linked in සමාජ මාධ්‍ය පවත්වාගෙනයාම සිදුකරයි. 2024 වර්ෂයේදී රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන් 39ක් සඳහා සම්පත් දායකත්වය ලබාදී තිබේ. ප්‍රවෘත්ති නිවේදන 09ක් නිකුත්කරන ලදී. ළමා අපයෝජන පිළිබඳ සදාචාරාත්මක වාර්තාකරණය සම්බන්ධයෙන් ජනමාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පවත්වන ලදී. ළමා ආරක්ෂාව සහ සයිබර් අපයෝජනයන්ගෙන් ආරක්ෂාවීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පවත්වන ලදී. ලෝක දුම්කොළ විරෝධී දිනය, ලෝක ළමා දිනය ආදී දිනයන් පාදක කරගනිමින් ළමා ආරක්ෂාව ප්‍රවර්ධනය සඳහා ප්‍රදර්ශන සහ ජංගම සේවා 02 ක් පවත්වන ලදී. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණ තොරතුරු ලබාගත් 43 දෙනෙකු සඳහා තොරතුරු ලබාදෙන ලදී.

ළමා ආරක්ෂාව පිළිබඳ රූපවාහිනී, ගුවන් විදුලි, පුවත්පත්, සහ සමාජ මාධ්‍ය භාවිත කරමින් මාධ්‍ය ව්‍යාපාරයක් සිදුකරන ලදී. දින සැමරුම් ලෙස 2024 වර්ෂයේ ලෝක ළමා දිනයට සමගාමීව ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ළමා අයිතිවාසිකම් සහ ළමා ආරක්ෂාව තේමා කර ගනිමින් සංවිධානය කරන ලද "සිතුවිලි සිත්තම" 2024 සමස්ත ලංකා චිත්‍ර, පෝස්ටර් සහ කාටූන් තරඟාවලියේ අවසන් විනිශ්චය කටයුතු සිදුකර ජාතික මට්ටමේ ජයග්‍රාහකයන් 51ක් සහ දිස්ත්‍රික් ජයග්‍රාහකයන් 768ක් ලෙස සමස්ත ජයග්‍රාහකයන් 819ක් තෝරාගන්නා ලදී.ජයග්‍රහකයින්ගේ නම් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වෙබ් අඩවියේ පළ කර ඇත. (www.childprotction.gov.lk)





## විශේෂ පොලිස් විමර්ශන, විමර්ශන නියාමනය, අපරාධ නඩු විධානයන් පිළිබඳ නිරීක්ෂණයන් ළමා අපචාර සහ අධිකරණ ක්‍රියාදාමයන් සම්බන්ධ සයිබර් සුපරීක්ෂණ

ළමා අපයෝජනවලින් වින්දිත වූ ළමුන්ගේ රැකවරණය සැලසීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ළමා අපයෝජන සම්බන්ධව විශේෂ විමර්ශනයන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත ප්‍රකාරව සිදුකරනු ලබයි. 2024 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය විසින් අධිකරණයේ පෙනී සිටීම් 2049ක් සම්පූර්ණ කර ඇත, (මහාධිකරණ 1131, මහේස්ත්‍රාත් අධිකරණ 918) ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නීති අංශය විසින් අධිකරණයේ පෙනී සිටීම් 12ක් සහ 803 දෙනෙකුට නීති සහය ලබාදීම් සිදුකර ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පැමිණ සහ දුරකතන මඟින් සයිබර් ආවේක්ෂණ පැමිණිලි 209ක් ලැබී ඇත.

| අනු අංකය | මාසය | විශේෂ පොලිස් ඒකකය අධිකරණයේ පෙනී සිටීම් සංඛ්‍යාව | නීති අංශය අධිකරණයේ පෙනී සිටීම් සංඛ්‍යාව | නීති සහය ලබාදීම් | සයිබර් ආවේක්ෂණ පැමිණිලි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ජනවාරි | 196 | 01 | 82 | 17 |
| 02 | පෙබරවාරි | 261 | 01 | 80 | 22 |
| 03 | මාර්තු | 188 | - | 88 | 13 |
| 04 | අප්‍රේල් | 122 | 04 | 79 | 15 |
| 05 | මැයි | 191 | 01 | 68 | 12 |
| 06 | ජූනි | 163 | - | 73 | 15 |
| 07 | ජූලි | 196 | - | 51 | 15 |
| 08 | අගෝස්තු | 132 | 01 | 64 | 21 |
| 09 | සැප්තැම්බර් | 184 | - | 62 | 20 |
| 10 | ඔක්තෝබර් | 179 | - | 43 | 23 |
| 11 | නොවැම්බර් | 108 | 02 | 68 | 14 |
| 12 | දෙසැම්බර් | 129 | - | 45 | 22 |
| **මුළු සංඛ්‍යාව** | | **2049** | **12** | **803** | **209** |

**මූලාශ්‍ර - නීති අංශය, නීතිය බලාත්මක කිරීමේ අංශය සහ විශේෂ පොලිස් විමර්ශන ඒකකය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක පිහිටුවීම, නඩත්තු කිරීම සහ අයිතිවාසිකම් උල්ලංඝණය වූ ළමුන් සඳහා සහාය වීම.

ළමා අපයෝජන හේතුවෙන් වින්දිතභාවයට පත් වන ළමුන් ද්විතීක වින්දිතභාවයට පත්වීම වැළැක්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ මේ වන විටත් මෙම සේවාව සිදුකරන අතර දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ (රාගම) ළමා පියස පරිශ්‍රයේ නව ළමා හිතකාමී වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකය මඟින් ළමයින්ගේ සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සිදුකරයි. 2024 වර්ෂයේදී වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් 205 අවසන් කරන ලදී. අධිකරණ නියෝග මත හා නීතිපති නියෝග මත වීඩියෝ සාක්ෂි පට 232ක් මුදා හැරීම සිදුකරන ලදී. අධිකරණයේ පෙනී සිටීම් 110ක් සිදුකර ඇත. අධිකරණ නියෝග මත හා නීතිපති නියෝග මත යතුරු ලියන පිටපත් මුදාහැරීම් 236ක් සිදුකර ඇත.

| අනු අංකය | මාසය | වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් සංඛ්‍යාව | වීඩියෝ සාක්ෂි පටිගත කිරීම්වල මුදා හරින ලද පිටපත් සංඛ්‍යාව | අධිකරණයේ පෙනී සිටීම් සංඛ්‍යාව | යතුරු ලියන පිටපත් මුදාහැරීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ජනවාරි | 17 | 12 | 19 | 11 |
| 02 | පෙබරවාරි | 20 | 20 | 13 | 22 |
| 03 | මාර්තු | 17 | 16 | 09 | 19 |
| 04 | අප්‍රේල් | 10 | 20 | 04 | 26 |
| 05 | මැයි | 19 | 06 | 16 | 04 |
| 06 | ජූනි | 14 | 15 | 13 | 11 |
| 07 | ජූලි | 09 | 21 | 10 | 31 |
| 08 | අගෝස්තු | 18 | 32 | 6 | 24 |
| 09 | සැප්තැම්බර් | 15 | 23 | 10 | 21 |
| 10 | ඔක්තෝබර් | 31 | 24 | 09 | 21 |
| 11 | නොවැම්බර් | 21 | 19 | 11 | 25 |
| 12 | දෙසැම්බර් | 14 | 21 | 7 | 21 |
| මුළු සංඛ්‍යාව | | 205 | 232 | 127 | 236 |

**මූලාශ්‍රය - නීතිය බලාත්මක කිරීමේ අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## ජාතික ළමා කේන්ද්‍රීය මනෝසමාජීය සහය සේවය

ළමුන්ගේ උපරිම යහපත අරමුණු කරගනිමින් මානසික යහපැවැත්ම තහවුරු කිරීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. අපයෝජනයට පත් වින්දිත, ආන්තික හා අත්හළ ළමුන්ගේ කායික, මානසික හා සමාජීය ගැටලු සඳහා අවශ්‍ය මනෝසමාජීය මැදිහත්කරණය ලබාදීම මෙයින් සිදුකරයි. ළමයෙකු තුළ සාර්ථක මනෝසමාජීය සංවර්ධනයක් ගොඩනැගීම සඳහා මානසික, සමාජයීය, සංස්කෘතික හා පාරිසරික තත්ත්වයන් සෘජුව බලපානු ලබයි. එවැනි අවස්ථාවන් හා පසුබිම් හඳුනාගනිමින් මනෝසමාජීය රැකවරණය ගොඩනැංවීම ළමුන්ගේ අනාගතය වෙනුවෙන් සිදු විය යුත්තකි.

වත්මන් සමාජ තත්ත්වයන් තුළ ළමුන්ට මුහුණපෑමට සිදුවන මානසික ගැටලු හේතුවෙන්, ළමුන් මානසික පීඩනයට ලක්වීම, ඉච්ඡාභංගත්වයට පත්වීම හා දුර්වල පෞරුෂත්ව ගොඩනැගීම මෙන්ම ප්‍රජානන හැකියාවන් වර්ධනය නොවීම වැනි බලපෑම් සහගත තත්ත්වයන් ඇතිවිය හැකිය. එවැනි ළමුන්ගේ උපරිම යහපත ගොඩනැගීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. 2024 වර්ෂයේදී මනෝසමාජීය සහය සහ සම්බන්ධීකරණය කිරීම් 405ක් සිදුකර ඇත. ළමුන් 119ක් සඳහා මනෝසමාජීය සහාය හා මැදිහත්වීම් ලබා දී ඇත. පැමිණිලිවල පසුවිපරම් 322ක් සිදුකර ඇත. මනෝසමාජීය මැදිහත්කරණයන් ලබාදී අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව 1581කි.ළමුන් සඳහා මනෝ චිකිත්සනය හා මනෝ උපදේශනය ලබාදීම් 118ක් සිදුකර ඇත. සිද්ධි සම්මන්ත්‍රණ 18ක් පවත්වා ඇත. වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා ළමුන්ගේ පූර්ව මානසික සූදානම් කිරීම වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම් 08ක් සිදුකර ඇත.

| අනු අංකය | මාසය | මනෝසමාජීය සහාය හා සම්බන්ධීණය කිරීම් සංඛ්‍යාව | පැමිණිලිවල පසු විපරම් සංඛ්‍යාව | මනෝසමාජීය මැදිහත්කරණයන් ලබාදී අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව | මනෝසමාජීය උපදේශන සංඛ්‍යාව | අධිකරණයේ පෙනී සිටීම් සංඛ්‍යාව | සිද්ධි සම්මන්ත්‍රණ සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | ජනවාරි | 39 | 06 | 07 | 08 | 02 | 02 |
| 02 | පෙබරවාරි | 84 | 31 | 29 | 10 | 02 | 03 |
| 03 | මාර්තු | 67 | 51 | 27 | 10 | 01 | 02 |
| 04 | අප්‍රේල් | 35 | 34 | 52 | 07 | - | 02 |
| 05 | මැයි | 37 | 28 | 264 | 10 | 01 | 02 |
| 06 | ජූනි | 42 | 19 | 400 | 10 | - | 01 |
| 07 | ජූලි | 32 | 35 | 103 | 12 | 01 | 01 |
| 08 | අගෝස්තු | 21 | 14 | 435 | 08 | - | - |
| 09 | සැප්තැම්බර් | 25 | 28 | 70 | 05 | - | - |
| 10 | ඔක්තෝබර් | 38 | 22 | 61 | 15 | - | 03 |
| 11 | නොවැම්බර් | 36 | 30 | 40 | 11 | 01 | - |
| 12 | දෙසැම්බර් | 23 | 24 | 93 | 12 | - | 02 |
| මුළු සංඛ්‍යාව | | 884 | 322 | 1581 | 118 | 08 | 18 |

**මූලාශ්‍රය - මනෝසමාජීය අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## ළමා අපයෝජන ප්‍රතිසාධන විෂය මාලාව (Child Abuse Recovery Curriculum)

වින්දිතභාවයට පත් වූ ළමුන් මනෝසමාජීයව ප්‍රතිසාධනය කර ඔවුන්ගේ කුසලතා සංවර්ධනය කිරීම හා ඔවුන් නැවත අපයෝජනය වීම වැළැක්වීම තුළින් සෞඛ්‍ය සම්පන්න පෞරුෂයන් ඔවුන් තුළ ගොඩගැනීම අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකාව තුළ විධිමත් ලෙස, වින්දිතයන් හට මනෝසමාජීය සහාය ලබාදීම වෙනුවෙන් චිකිත්සක ආදර්ශයක් ලෙස මෙම ප්‍රතිසාධන විෂය මාලාව භාවිතා කිරීම මෙහි මූලික අරමුණු වේ. 2024 වර්ෂයේදී ප්‍රතිසාධන විෂයමාලාවේ ප්‍රමිතිගතකරණය කිරීමේ කටයුතු කිරීමේ අවසන් කර ඇත.

## වැව්ලි ක්ෂේත්‍රය ආශ්‍රිතව වෙසෙන ළමුන්ගේ යහපැවැත්ම සහතික කිරීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන විශේෂ ප්‍රජා වැඩසටහන

ළමා සුරක්ෂිතතාව වර්ධනය කිරීමට අදාළව වැව්ලි ප්‍රජාව බලගැන්වීමත්, ඒ තුළින් ළමුන්ට වඩාත් සුදුසු පරිසරයක් ඔවුන් විසින් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීම තුළින් ළමා ආරක්ෂණය උදෙසා සක්‍රීය වැව්ලි ප්‍රජා ජාලයක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ වේ. 2024 වර්ෂයේදී වැඩසටහන් 17ක් පවත්වන ලදී. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 701 දෙනෙකි. 2022 සහ 2023 වර්ෂවලදී වැඩසටහන් ක්‍රියාත්මක කළ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නිලධාරීන් උදෙසා නුවරඑළියේදී එක්දින පුහුණු වැඩමුළුවක්ද පවත්වන ලද අතර මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 26 දෙනෙකි. කෝත්මලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ඩන්සිනන්වත්ත ආශ්‍රිතව සිදුකර ඇති වැඩසටහන් හා ක්‍රියාකාරකම් පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාව හා දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වා ඇති අතර මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 50කි.






## වෙරළබඩ කලාපය ආශ්‍රිත ගම්මානවල ජීවත්වන ළමුන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම නඟා සිටුවීම උදෙසා ක්‍රියාත්මක කෙරෙන ප්‍රජාපාදක වැඩසටහන

ළමා සුරක්ෂිතතාව වර්ධනය කිරීමට අදාළව වෙරළබඩ කලාපය ආශ්‍රිත ප්‍රජා බලගැන්වීමත් එය තුළින් ළමුන්ට වඩාත් සුදුසු අපයෝජනවලින් තොර ආරක්ෂිත පරිසරයක් ප්‍රජාව විසින්ම නිර්මාණය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීම තුළින් ළමා ආරක්ෂණය උදෙසා සක්‍රීය වෙරළබඩ කලාපය ආශ්‍රිත ප්‍රජා ජාලයක් නිර්මාණය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. 2024 වර්ෂයේදී ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 12 ක් පවත්වන ලදී. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 405 දෙනෙකි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | මුලතිවු | 01 | 30 |
| 02 | අම්පාර | 01 | 39 |
| 03 | පුත්තලම | 01 | 40 |
| 04 | ගාල්ල | 01 | 38 |
| 05 | යාපනය | 02 | 40 |
| 06 | මන්නාරම | 01 | 30 |
| 07 | ගම්පහ | 01 | 42 |

| | | | |
|---|---|---|---|
| 08 | හම්බන්තොට | 01 | 33 |
| 09 | මාතර | 01 | 30 |
| 10 | ත්‍රිකුණාමළය | 01 | 33 |
| 11 | කළුතර | 01 | 50 |
| **මුළු සංඛ්‍යාව** | | **12** | **405** |

**මූලාශ්‍රය - පර්යේෂණ සහ සංවර්ධන අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**





## නවාතැන් පහසුකම් සපයන ආයතන හිමිකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන

නවාතැන් පහසුකම් සපයන ආයතනවලදී ළමයින්ට සිදුවිය හැකි සියලු ආකාරයේ අපයෝජනයන්ගෙන් ළමුන් ආරක්ෂා කිරීම සඳහා එම ආයතන ප්‍රධානීන් මූලික දැනුවත් කිරීමකින් පසුව විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම මෙහි මූලික අරමුණු වේ. 2024 වර්ෂයේදී වැඩසටහන් 08ක් පවත්වන ලදී. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 465 දෙනෙකි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කුරුණෑගල | 01 | 58 |
| 02 | යාපනය | 01 | 45 |
| 03 | හම්බන්තොට | 01 | 50 |
| 04 | අනුරාධපුරය | 02 | 74 |
| 05 | අම්පාර | 02 | 157 |
| 06 | රත්නපුර | 01 | 81 |
| **මුළු සංඛ්‍යාව** | | **08** | 465 |

**මූලාශ්‍රය - පර්යේෂණ සහ සංවර්ධන අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## ග්‍රාමීය මට්ටමෙන් ළමුන්ගේ සුරක්ෂිතතාවය වර්ධනය කිරීම උදෙසා ප්‍රජා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේ දීපව්‍යාප්ත වැඩසටහන ("අපේ ළමුන්ට වඩා සුරක්ෂිත ගමක්")

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තොරතුරු සාක්ෂි පදනම් කරගනිමින් තෝරාගත් ග්‍රාමයක ළමා සුරක්ෂිතතාවය වර්ධනය කිරීමට අදාළව ප්‍රජාව බලගැන්වීමත් ඒ තුළින් ළමුන්ට වඩාත් සුදුසු ගමක් ස්ථාපිත කිරීම මෙහි මූලික අරමුණ වේ.2024 වර්ෂයේදී වැඩසටහන් 74ක් පවත්වන ලදී. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 3567 දෙනෙකි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කොළඹ | 02 | 75 |
| 02 | ගාල්ල | 04 | 164 |
| 03 | මාතර | 05 | 166 |
| 04 | බදුල්ල | 01 | 140 |
| 05 | මොනරාගල | 01 | 50 |
| 06 | ත්‍රිකුණාමලය | 02 | 67 |
| 07 | මඩකලපුව | 01 | 40 |
| 08 | අම්පාර | 02 | 142 |
| 09 | පුත්තලම | 01 | 53 |
| 10 | කුරුණෑගල | 03 | 64 |
| 11 | මහනුවර | 03 | 101 |
| 12 | මාතලේ | 02 | 82 |
| 13 | නුවරඑළිය | 01 | 34 |
| 14 | අනුරාධපුරය | 04 | 165 |
| 15 | කෑගල්ල | 01 | 37 |
| 16 | යාපනය | 02 | 37 |
| **මුළු සංඛ්‍යාව** | | **35** | **1417** |

**මූලාශ්‍රය - පර්යේෂණ සහ සංවර්ධන අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## පාසල් ළමුන් ප්‍රවාහනය කරන රියදුරන් හා සහායකයින් ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන

පාසල් ළමුන් ප්‍රවාහනය කරන රියදුරන් හා සහායකයින් ළමා ආරක්ෂාව හා පැවැත්ම තහවුරු කිරීම උදෙසා බල ගැන්වීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ. 2024 වර්ෂයේදී මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. වැඩසටහන් 10ක් පවත්වන ලදී. මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1608 දෙනෙකි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ගම්පහ | 01 | 157 |
| 02 | මාතර | 01 | 150 |
| 03 | අම්පාර | 02 | 213 |
| 04 | කුරුණෑගල | 02 | 339 |
| 05 | මහනුවර | 01 | 552 |
| 06 | මාතලේ | 01 | 102 |
| 07 | අනුරාධපුරය | 01 | 26 |
| 08 | මුලතිව් | 01 | 69 |
| **මුළු සංඛ්‍යාව** | | **10** | **1608** |

**මූලාශ්‍රය - පර්යේෂණ සහ සංවර්ධන අංශය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## විශේෂ පොලිස් විමර්ශන

ජාතික ළමා ආරක්ෂක අධිකාරියට, 1929 ශ්‍රී ලංකා ළමා උපකාරක දුරකථන සේවය ඔස්සේ හා වෙනත් ක්‍රම මඟින් ලැබෙන ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි කඩිනමින් විමර්ශනය කර නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විශේෂ පොලිස් විමර්ශන ඒකකය කටයුතු කරනු ලබයි.

| අනු අංකය | වරද | වාර්තා වූ ගණන | විමර්ශනය වන ගණන | විමර්ශනය අවසන් ගණන | අසත්‍ය | අධිකරණයට යොමුකළ ගණන | අධිකරණයේ කැඳවන ගණන | බැහැර පොලිස් ස්ථානවලට විමර්ශන සඳහා යොමු කළ |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | බල අපරාධ | 08 | 02 | 06 | - | 08 | 07 | - |
| මුළු සංඛ්‍යාව | | 08 | 02 | 06 | - | 08 | 07 | - |

**මූලාශ්‍රය - විශේෂ පොලිස් විමර්ශන ඒකකය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

## 2024/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. පොදු තොරතුරු

1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා ඇති අතර එහි ප්‍රධාන කාර්යාලය අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර යන ලිපිනයේ පිහිටා ඇත.

### 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අනුගමනය කරන ලද මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් කර ඇත. අන්‍යාකාරයකින් සඳහන් කර ඇත්නම් මිස, මෙහි සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සියලුම වර්ෂයන් සඳහා අඛණ්ඩව අදාළ කරගෙන ඇත. මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය (ශේෂ පත්‍රය), මූල්‍ය කාර්යසාධනය (ආදායම් ප්‍රකාශය), හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ආදිය ඇතුළත් වේ.

### 3. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කෙරේ. 1972 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 (අ) (xxvi) වගන්තිය සහ 42 (ඊ) වගන්තිය මඟින් සලසා ඇති විධිවිධාන යටතේ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ආදායම් බද්දට යටත් නොවේ. මූල්‍ය ප්‍රකාශ පිරිවැය පදනම යටතේ සකස් කෙරේ.

**<u>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ගිණුම් පිළියෙල කිරීමේදී පහත සඳහන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇත.</u>**

### ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මෙම ප්‍රමිතිය මඟින් ආයතනයේ පූර්ව කාල පරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශන, අනෙකුත් ආයතනවල මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීම තහවුරු කිරීම සඳහා පොදු මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළයුතු ආකාරය නිශ්චිතව දක්වයි. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා මෙම ප්‍රමිතිය මඟින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම, ඒවායේ ව්‍යුහය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සැපයීම සහ ගිණුම්කරණ උපචිත පදනම යටතේ සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගතය සඳහා වන නියමයන් සම්බන්ධයෙන් සමස්ථ සලකා බැලීම් ඉදිරිපත් කරයි. පිළිගැනීම, මිනුම්ක්‍රම සහ විශේෂිත ගනුදෙනු හෙළිදරව් සහ අනෙකුත් කාරණා මේ යටතට අයත් වේ.

### ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 2 - මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය මඟින් මුදල් ප්‍රවාහ මූලාශ්‍ර, වාර්තාකරණ කාල පරිච්ඡේදය තුළ මුදල් වියදම් කර ඇති අයිතමයන් සහ වාර්තා කරන දිනට මුදල් ශේෂය හඳුනා ගනියි. ආයතනයක මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට වගකීම සහ තීරණ ගැනීමේ අරමුණු සඳහා ප්‍රයෝජනවත් වේ. මුදල් ප්‍රවාහ තොරතුරු මඟින් රාජ්‍ය අංශයේ ආයතනයක් තම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය අරමුදල් රැස් කරන්නේ කෙසේද යන්න සහ එකී මුදල් භාවිතා කරන්නේ කවරාකාරයටද යන්න පිළිබඳ නිශ්චය කිරීම සඳහා පරිශීලකයන්ට අවස්ථාව සලසයි. ආයතනයේ ක්‍රියාකාරකම්වල තිරසාරභාවය ආදී සම්පත් වෙන් කිරීම් පිළිබඳ තීරණ ගැනීමේදී සහ තොරතුරු ඇගයීමේදී පරිශීලකයන්ට මුදල් ප්‍රවාහවල කාලය සහ නිශ්චිත බව පිළිබඳ අවබෝධයක් අවශ්‍ය වේ. මෙම ප්‍රමිතියේ අරමුණ වන්නේ මෙහෙයවීම, ආයෝජනය සහ මූල්‍යකරණ ක්‍රියාකාරකම් සිදුකරන කාලපරිච්ඡේදය තුළ මුදල් ප්‍රවාහයන් වර්ගීකරණය කරනු ලබන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් මඟින් ආයතනයේ මුදල් සහ මුදල් සමාන දෑ වල ඓතිහාසික වෙනස්කම් පිළිබඳව අවශ්‍ය තොරුතුරු සැපයීමයි.

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ**

මෙම ප්‍රමිතිය මගින් ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ වෙනස් කිරීම සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් හෙළිදරව් කිරීම සහ මූල්‍ය ගනුදෙනු මෙහෙයවීම නිශ්චය කිරීමේදී භාවිතා කළ යුතු රීති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් කිරීම දෝෂ නිවැරදි කිරීම ආදිය සඳහා නිර්ණායක නියම කරයි. තවද, මෙම ප්‍රමිතිය මගින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල අදාලත්වය සහ විශ්වසනීය බව ඉහළ නැංවීමට අපේක්ෂා කරන අතර, එම මූල්‍ය ප්‍රකාශන කාලානුරූපීව අනෙකුත් ආයතනවල මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනය කිරීමට ද උපකාරී වේ.

1. ක්ෂය කිරීම

ඉඩම්, ක්ෂය කිරීම්වලට යටත් නොවේ. අනෙකුත් වත්කම් ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමයට පහත සඳහන් පරිදි ක්ෂය කරනු ලබයි. යම් දේපළ, පිරියත සහ උපකරණ මිලදීගත් අවස්ථාවේ සිට එය භාවිතයෙන් ඉවත් කරන තෙක් ඒ සඳහා ක්ෂය ප්‍රතිපාදන සලසනු ලබයි.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| මෝටර් රථ | 10% |
| කාර්යාල ලී බඩු | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| පරිගණක සහ උපාංග | 25% |
| ක්‍රීඩා භාණ්ඩ | 15% |
| සංගීත භාණ්ඩ | 25% |
| කෘෂි උපකරණ | 25% |

නිශ්චිත පරිත්‍යාගශීලි නියෝජිතායතන සමඟ අත්සන් තබා ඇති ගිවිසුමට අනුව ව්‍යාපෘති අරමුදල් භාවිතා කර මිලදීගත් අයිතමයන්, පිරියත සහ උපකරණ කිසිවක් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ගිවිසුම්වලට ඇතුළත් නොවේ. ව්‍යාපෘති අරමුදල් යටතේ මිලදීගත් දේපළ, පිරියත සහ උපකරණ අදාළ පරිත්‍යාගශීලි නියෝජිතායතනය වෙත අයත්ය. එම උපකරණවල හිමිකාරිත්වය ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත පවරන තෙක් ව්‍යාපෘති සඳහා වෙනම වත්කම් ලැයිස්තු පවත්වාගෙන යනු ලැබේ.

2. ක්‍රමක්ෂය

බදු කාල පරිච්ඡේදය පදනම් කරගනිමින් ඉඩම් ක්‍රමක්ෂය කරනු ලැබේ. අනෙකුත් වත්කම් පහත සඳහන් ක්ෂය අනුපාත යටතේ ක්‍රමක්ෂය කරනු ලැබේ.

| ඉඩම් පිළිබඳ තොරතුරු | බදු කාල පරිච්ඡේදය (වර්ෂ) |
|---|---|
| ඉඩම් (2000) | 50 |
| ඉඩම් (2016) | 30 |

අනෙකුත් වත්කම් ක්‍රමක්ෂය අනුපාතය

| | |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| මෝටර් රථ | 10% |
| කාර්යාල ගෘහ භාණ්ඩ | 15% |
| කාර්යාල උපකරණ | 15% |
| පරිගණක සහ උපාංග | 25% |
| ක්‍රීඩා භාණ්ඩ | 15% |
| සංගීත භාණ්ඩ | 25% |
| කෘෂි උපකරණ | 25% |

**ගිණුම් සඳහා සටහන්**

**සටහන 01 - ක්‍රමක්ෂය**

වන්දි ගෙවීමට අපේක්ෂිත අදාළ පිරිවැය ආයතනය විසින් වියදම් වශයෙන් හඳුනා ගැනෙන අතර ප්‍රදාන, කාල පරිච්ඡේදය පුරා ලාභ හෝ අලාභ පදනම මත හඳුනා ගැනේ.

**සටහන 02 - විලම්භිත ආදායම්**

2024 ස්ථාවර වත්කම්වලට සාපේක්ෂව වාර්ෂික ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය වටිනාකම, සටහන “1 ආ”හි දක්වා ඇති විවිධ ආදායම් ගිණුමට ඇතුළත් කර ඇත.

**සටහන 03 - උපචිත වියදම්**

2025.01.31 දිනට වාර්තාගත වූ උපචිත වියදම් පමණක් මුළු උපචිත වියදම් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් වේ.

**සටහන 04 - පාරිතෝෂික ප්‍රතිපාදන**

වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් සඳහා 2024 වසර සඳහා පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කර ඇත.

**සටහන 05- අවසන් තොග**

ලිපිද්‍රව්‍ය අවසන් තොග "සාමාන්‍ය පිරිවැය පදනම" මත අගය කර ඇත.

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

| විස්තරය | සටහන් | රු. 2024 | රු. 2023 |
|---|---|---|---|
| ආදායම | | | |
| පුනරාවර්තන ප්‍රදාන - මහාභාණ්ඩාගාරය | | 312,168,300.00 | 279,390,000.00 |
| - අනෙකුත් ආයතන | 1(අ) | 5,140,065.20 | 3,957,163.00 |
| අනෙකුත් ආදායම් | 1(ආ) | 15,947,022.71 | 15,960,197.77 |
| ජාතික ක්‍රියාකාරී සැලැස්ම සඳහා භාණ්ඩාගාර ප්‍රදාන | | 38,498,080.00 | 34,447,243.97 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල සඳහා ප්‍රදාන | 1(ඇ) | 193,065.74 | 437,429.14 |
| මුළු ආදායම | | 371,946,533.65 | 334,192,033.88 |
| වියදම් | | | |
| පරිපාලන වියදම් | 2 | 297,581,780.40 | 260,898,047.14 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 3 | 77,357,561.55 | 79,837,639.02 |
| ව්‍යාපෘති වියදම් | 4 | 5,140,065.20 | 3,957,163.00 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම් | 5 | 93,000.00 | 839,884.94 |
| මූල්‍ය වියදම් | 6 | 605.10 | 530.73 |
| මුළු වියදම් | | 380,173,012.25 | 345,533,264.83 |
| කාලච්ඡේදයට අදාළ ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) | 7 | (8,226,478.60) | (11,341,230.95) |

| | | |
|---|---|---|
| අතිරික්තය / ඌනතාවය - සාරාංශය | | |
| කාලච්ඡේදයට අදාළ ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) භාණ්ඩාගාර අරමුදල් | | (8,326,544.34) |
| කාලච්ඡේදයට අදාළ ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) ජාතික ළමා ආරක්ෂක අරමුදල | | 100,065.74 |
| කාලච්ඡේදයට අදාළ ශුද්ධ අතිරික්තය / (ඌනතාවය) | | (8,226,478.60) |

## ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
## 2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විස්තරය | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 8 | 175,754,474.59 | 181,519,432.38 |
| කල්බදු ඉඩම් | 8.1 | 17,033,659.91 | 17,812,701.01 |
| දිගුකාලීන ලැබියයුතු වත්කම් | 9 | 2,782,677.59 | 2,425,739.83 |
| | | **195,570,812.09** | **201,757,873.22** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොගය - ලිපි ද්‍රව්‍ය | | 2,165,226.90 | 1,140,746.82 |
| ආයෝජන සහ ඉතුරුම් | 10 | 10,649,565.21 | 9,347,501.25 |
| ලැබියයුතු ගිණුම් | 11 | 1,723,998.92 | 2,981,613.58 |
| ඉදිරියට කළ ගෙවීම් | 12 | 496,304.71 | 392,792.85 |
| මුදල් හා මුදල්වලට සමාන දෑ | 13 | 8,338,988.56 | 3,684,796.85 |
| | | **23,374,084.30** | **17,547,451.35** |
| **මුළු වත්කම්** | | **218,944,896.39** | **219,305,324.57** |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 91,098,000.00 | 72,932,907.50 |
| ව්‍යාපෘති ගිණුම්වල අතිරික්තය | 14 - (අ) | 1,075,825.27 | 877,075.27 |
| ජාතික ළමා ආරක්ෂක අරමුදල | 14 - (ආ) | 1,793,110.18 | 1,693,044.44 |
| | | **93,966,935.45** | **75,503,027.21** |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 15 | 5,483,263.98 | 8,729,111.57 |
| කෙටිකාලීන වෙන් කිරීම් | 16 | 2,707,222.50 | 950,893.50 |
| | | **8,190,486.48** | **9,680,005.07** |
| **මුළු වගකීම්** | | **102,157,421.93** | **85,183,032.28** |
| **ශුද්ධ වත්කම්** | | **116,787,474.46** | **134,122,292.29** |
| **මූල්‍යනය වන්නේ** | | | |
| ප්‍රාග්ධන ප්‍රදානයන් | 17 | 36,452,455.44 | 38,516,248.32 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 154,063,671.10 | 160,366,469.85 |
| රඳවාගත් ඉපැයුම් | | (73,728,652.08) | (64,760,425.88) |
| | | **116,787,474.46** | **134,122,292.29** |

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

**2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| තොරතුරු | සටහන් | රු. 2024 | රු. 2023 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ අතිරික්තය / (ඌනතාවය) | | (8,226,478.60) | (11,341,230.95) |
| <u>පෙර වසරේ ගැලපුම්</u> | | | |
| රඳවාගත් ඉපැයීම් | | (641,681.87) | (1,438,212.08) |
| **මුදල් නොවන සංචලනයන්** | | | |
| ක්ෂයවීම් | 8 | 13,454,331.45 | 13,336,809.06 |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය | 8.1 | 779,041.10 | 779,041.10 |
| පරිත්‍යාගවලින් ලැබූ ස්ථාවර වත්කම් | | 5,866,780.93 | (3,409,700.48) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමෙන් ලද ලාභය / අලාභය | | 31,545.27 | - |
| වත්කම් ඉවත් කිරීමේ ක්ෂය | | - | (355,015.00) |
| ක්‍රමක්ෂය වූ ව්‍යාපෘති අරමුදල් | | (5,140,065.20) | (3,957,163.00) |
| ක්‍රමක්ෂය වූ ප්‍රත්‍යාගණන සංචිත | | (14,233,372.55) | (6,303,511.40) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| ගෙවියයුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්) | | (3,245,847.59) | 5,863,699.76 |
| කෙටිකාලීන වෙන් කිරීම් වැඩිවීම් / (අඩුවීම්) | | 23,900.00 | 26,100.00 |
| තොග වැඩිවීම් / (අඩුවීම්) | | (1,024,480.08) | (179,201.43) |
| ලැබියයුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්) | | 1,257,614.66 | (55,999.54) |
| ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම් / (අඩුවීම්) | | (103,511.86) | 248,011.04 |
| පාරිතෝෂික දායකය | | 24,384,717.50 | 8,170,077.50 |
| පාරිතෝෂික ගෙවීම් | | (4,487,196.00) | (1,713,310.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **8,695,297.16** | **(329,605.42)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | | (7,768,468.93) | (697,756.03) |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් | | 47,550.00 | 355,015.00 |
| දිගුකාලීන ලැබියයුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්) | | (356,937.76) | (456,132.38) |
| ආයෝජන ප්‍රතිලාභ | | (779,506.47) | (550,616.06) |
| ස්ථාවර තැන්පතු වැඩිවීම | | (522,557.49) | (764,218.74) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **(9,379,920.65)** | **(2,113,708.21)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| ව්‍යාපෘති අරමුදල් සඳහා ප්‍රතිපාදන | 14 | 5,338,815.20 | 3,378,000.00 |
| ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | | - | (3,440,856.48) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **5,338,815.20** | **(62,856.48)** |
| **මුදල් සහ මුදල්වලට සමාන දෑවල ශුද්ධ අඩුවීම** | | **4,654,191.71** | **(2,506,170.11)** |
| **කාලපරිච්ඡේදයේ ආරම්භක මුදල් හා මුදල්වලට සමාන දෑ** | | **3,684,796.85** | **6,190,966.96** |
| **කාලපරිච්ඡේදයේ අවසාන මුදල් හා මුදල්වලට සමාන දෑ** | **13** | **8,338,988.56** | **3,684,796.85** |

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

රු.

| | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යාගණන සංචිත | රඳවාගත් ඉපැයුම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|
| **2023 ජනවාරි 01 දිනට ගලපන ලද ශේෂය** | **41,957,104.80** | **166,669,981.25** | **(52,383,438.65)** | **156,243,647.40** |
| **විස්තීර්ණ ආදායම** | | | | |
| වර්ෂය සඳහා ලාභය | - | - | (10,938,775.15) | (10,938,775.15) |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (3,440,856.49) | (6,303,511.40) | (1,438,212.08) | (11,182,579.97) |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,516,248.31** | **160,366,469.85** | **(64,760,425.87)** | **134,122,292.28** |
| පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් | - | - | (641,681.87) | (641,681.87) |
| වර්ෂය සඳහා ලාභය හෝ අලාභය | - | - | (8,326,544.34) | (8,326,544.34) |
| අනෙකුත් මුළු විස්තීර්ණ ආදායම හෝ වියදම | (2,063,792.87) | (6,302,798.75) | - | (8,366,591.62) |
| **2024 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **36,452,455.44** | **154,063,671.10** | **(73,728,652.08)** | **116,787,474.45** |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

| | රු. | රු. |
|---|---|---|
| **සටහන් 1 අ** | **2024** | **2023** |
| **පුනරාවර්තන ප්‍රදාන - අනෙකුත් පරිත්‍යාගශීලි නියෝජිතාය** | | |
| යුනිසෙෆ් ක්‍රියාකාරි සැලැස්ම | 5,027,065.20 | 3,141,750.00 |
| මහජන බැංකුව | - | 410,413.00 |
| සුනාමි අරමුදලේ ආදායම් | 113,000.00 | 405,000.00 |
| **එකතුව** | **5,140,065.20** | **3,957,163.00** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන් 1 ආ** | **2024** | **2023** |
| **අනෙකුත් ආදායම්** | | |
| අමාත්‍යාංශය විසින් ප්‍රතිපූරණය කිරීම | 715,853.26 | - |
| පොලී ආදායම් | 538,378.92 | 964,858.68 |
| ආපදා ණය පොලී | 144,189.98 | 115,405.87 |
| විවිධ ආදායම් | 315,228.00 | 747,183.06 |
| විලම්භිත අදායම් | 14,233,372.55 | 14,115,850.16 |
| අබලි භාණ්ඩ විකුණුම් ගිණුම | - | 16,900.00 |
| **එකතුව** | **15,947,022.71** | **15,960,197.77** |

| සටහන් 1 ඇ | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **ලැබීම් - ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අරමුදල** | | |
| **ජාතික ළමා ආරක්ෂක අධිකාරිය අරමුදල** | 193,065.74 | 437,429.14 |
| **එකතුව** | **193,065.74** | **437,429.14** |

**සටහන 2 - පරිපාලන වියදම් 2 -**

| සටහන 2.1 | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **සේවක පඩිනඩි** | | |
| කාර්යමණ්ඩල වැටුප් හා වේතන | 140,203,551.93 | 150,563,526.76 |
| සේවක අර්ථ සාධක අරමුදල | 24,120,148.34 | 21,747,410.36 |
| සේවක භාරකාර අරමුදල | 6,042,643.15 | 5,454,042.68 |
| මාසික දීමනා | 22,154,565.78 | 23,766,110.29 |
| විශේෂ දීමනා (Cool Allowance) | 68,623.60 | 70,661.65 |
| අතිකාල | 1,897,618.91 | 1,680,007.61 |
| නිවාඩු දින ගෙවීම් | 201,794.75 | 79,045.50 |
| ජීවන වියදම් දීමනා | 60,953,154.71 | 30,614,242.17 |
| පාරිතෝෂික දායක මුදල් | 24,384,717.50 | 8,170,077.50 |
| වැඩ බැලීමේ ගෙවීම් | 5,998,180.86 | 5,148,949.40 |
| ආධුනික පුහුණුවන්නන් සඳහා දීමනා ගෙවීම් | 1,434,500.00 | 1,747,000.00 |
| ඉන්ධන සහ වාහන දීමනා | 7,014,708.25 | 8,184,973.22 |
| **එකතුව** | **294,474,207.78** | **257,226,047.14** |

| සටහන 2.2 | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **ගමන් වියදම්** | | |
| ගමන් වියදම් සහ සංයුක්ත දීමනා - දිස්ත්‍රික් නිලධාරීන් | 2,618,583.47 | 3,358,464.67 |
| කාර්යාල කාර්ය මණ්ඩලය | 68,205.00 | 54,950.00 |
| වාහන කුලී ගාස්තු | 380,074.15 | 258,585.33 |
| විදේශ ගමන් වියදම් | 38,060.00 | - |
| ප්‍රවාහනය | 2,650.00 | - |
| **එකතුව** | **3,107,572.62** | **3,672,000.00** |

**සටහන 3 - අනෙකුත් මෙහෙයුම් වියදම්**

| සටහන 3.1 | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| **සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය** | | |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 1,700,654.95 | 3,206,429.19 |
| දිස්ත්‍රික් නිලධාරීන් සඳහා ලිපිද්‍රව්‍ය | 1,416,678.85 | 1,059,362.18 |
| පුවත්පත් | 315,189.00 | 332,160.00 |
| ඉන්ධන | 833,958.00 | 1,242,700.00 |
| **එකතුව** | **4,266,480.80** | **5,840,651.37** |

| සටහන 3.2 | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|
| **නඩත්තු වියදම්** | | |
| මෝටර්රථ | 2,435,271.39 | 2,438,423.72 |
| පරිගණක සහ උපකරණ | 2,301,205.41 | 996,905.41 |
| ගොඩනැගිල්ල සහ කාර්යාලය | 664,963.15 | 535,957.00 |
| **එකතුව** | **5,401,439.95** | **3,971,286.13** |

| **සටහන 3.3** | **2024** | **2023** |
|---|---|---|
| **කොන්ත්‍රාත්ගත සේවා** | | |
| දුරකථන ගාස්තු | 4,647,803.90 | 5,187,762.99 |
| මුද්දර සහ තැපැල් ගාස්තු | 733,135.00 | 725,200.00 |
| විදුලි ගාස්තු | 5,339,056.87 | 5,386,653.56 |
| ජලගාස්තු | 279,966.93 | 380,852.66 |
| රක්ෂණය | 258,130.05 | 554,520.41 |
| ආරක්ෂක සේවා | 2,612,902.61 | 3,996,776.58 |
| සනීපාරක්ෂක සේවා | 2,337,336.12 | 1,989,086.25 |
| වෙළඳ දැන්වීම් | 644,631.20 | - |
| මුද්‍රණ ගාස්තු | 31,430.00 | 11,315.00 |
| පරිවර්තන ගාස්තු | 7,112.50 | - |
| වරිපනම් සහ බදු | 79,299.38 | 81,816.38 |
| විගණන ගාස්තු | 500,000.00 | 476,100.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | 548,820.00 | 732,236.10 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 21,760.00 | 189,344.00 |
| විගණන හා කළමනාකරණ කමිටුව | 70,801.00 | 131,595.00 |
| වෙබ් අඩවි නඩත්තුව | 326,407.68 | 315,381.60 |
| සේවා ගිවිසුම - පරිගණක සහ අනෙකුත් | 677,806.60 | 788,007.87 |
| 1929 ආහාර දීමනාව | 318,400.00 | 299,200.00 |
| **එකතුව** | **19,434,799.84** | **21,245,848.40** |

| සටහන 3.4 | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **ක්ෂය/ක්‍රමක්ෂය** | | |
| බදු දේපළ | 779,041.10 | 779,041.10 |
| ගොඩනැගිලි | 2,727,517.50 | 2,727,517.50 |
| මෝටර්රථ | 4,089,500.00 | 4,844,500.00 |
| ලී බඩු | 799,623.99 | 1,007,277.02 |
| උපකරණ | 4,223,243.17 | 3,060,358.66 |
| SAIEVAC ව්‍යාපෘතිය | | |
| - උපකරණ | 750.00 | 750.00 |
| UNDP ව්‍යාපෘතිය | | |
| - උපකරණ | 267,399.79 | 267,399.79 |
| UNICEF ව්‍යාපෘතිය | | |
| - මෝටර්රථ | 660,300.00 | 660,300.00 |
| - උපකරණ | 665,900.00 | 748,609.09 |
| SAVE THE CHILDREN - උපකරණ | 20,097.00 | 20,097.00 |
| **එකතුව** | **14,233,372.55** | **14,115,850.16** |

| සටහන 3.5 | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **අනෙකුත් මෙහෙයුම් වියදම්** | | |
| විවිධ වියදම් | 259,360.00 | 109,734.00 |
| සභාපති - සංග්‍රහ වියදම් | 567,284.25 | 421,336.75 |
| ස්ථාවර වත්කම් බැහැර කිරීම A / C | 31,545.27 | - |
| **එකතුව** | **858,189.52** | **531,070.75** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 3.6** | **2024** | **2023** |
| **NDAP- වියදම් ක්‍රියාත්මක කිරීම** | | |
| ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ දත්ත පද්ධතිය නඩත්තු කිරීම | 3,372,804.65 | 3,882,612.07 |
| ළමා ආරක්ෂාව සුවිශේෂ වූ විධිවිධාන සැලැස්ම | 13,302,672.33 | 12,165,058.08 |
| ළමා සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය සහ අධීක්ෂණය, ළමා අපයෝජන වැළැක්වීම සහ පසු විපරම් | 10,870,706.90 | 11,116,560.25 |
| ළමා අපයෝජන පැමිණිලි භාර ගැනීම සහ ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම | 2,788,764.28 | 3,845,328.36 |
| ළමුන්ට එරෙහි සහසිකත්වයට අදාළ දැනුම මෙහෙයවීම, ප්‍රවර්ධනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම | 428,425.75 | 341,708.50 |
| සුනාමි ආපදා සහන වැඩසටහන පැවැත්වීම | 498,535.00 | 568,665.00 |
| ළමා ආරක්ෂාව සඳහා සංවර්ධන වැඩසටහන්, වැඩමුළු, සාකච්ඡා සහ අනෙකුත් දෑ. | 1,508,209.10 | 1,384,507.95 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ සේවකයින්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් සහ නඩත්තු කටයුතු | 114,889.00 | 828,492.00 |
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ළමුන් සඳහා සමාජ ආරක්ෂණ වැඩසටහන් | 278,271.88 | - |
| **එකතුව** | **33,163,278.89** | **34,132,932.21** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන් 4** | **2024** | **2023** |
| **ව්‍යාපෘති වියදම්** | | |
| UNICEF ක්‍රියාකාරී සැලස්ම | 5,027,065.20 | 3,141,750.00 |
| සිතුවිලි සිත්තම් වියදම් | - | 410,413.00 |
| සුනාමි අනුග්‍රාහක දිමනා ඩේලි මිරර් | 113,000.00 | 405,000.00 |
| **එකතුව** | **5,140,065.20** | **3,957,163.00** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 5** | 2024 | 2023 |
| **ජාතික ළමා ආරක්ෂක අරමුදලේ වියදම්** | | |
| සුනාමි ප්‍රතිලාභීන් | 33,000.00 | - |
| **ජාතික ළමා ආරක්ෂක අරමුදලේ ගෙවීම්** | 60,000.00 | 839,884.94 |
| **එකතුව** | **93,000.00** | **839,884.94** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 6** | **2024** | **2023** |
| **මූල්‍ය වියදම්** | | |
| බැංකු ගාස්තු | 605.10 | 530.73 |
| **එකතුව** | **605.10** | **530.73** |

| | රු. | රු. |
|---|---|---|
| **සටහන 7** | **2024** | **2023** |
| **කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)** | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ ඌනතාවය (මහා භාණ්ඩාගාරය) | (8,326,544.34) | (10,938,775.15) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ ඌනතාවය (ව්‍යාපෘති) | - | - |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය/ ජාතික ළමා ආරක්ෂක අරමුදල | 100,065.74 | (402,455.80) |
| **එකතුව** | **(8,226,478.60)** | **(11,341,230.95)** |

| සටහන 8 | | | | | රු. |
|---|---|---|---|---|---|
| **දේපළ, පිරියත සහ උපකරණ** | **2024.01.01 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | **එකතු කිරීම** | **ඉවත් කිරීම්** | **පූර්ව වර්ෂයේ ගැලපීම්** | **2024.12.31 දිනට පහළට ගෙනා ශේෂය** |
| **පිරිවැය / තක්සේරු කිරීම** | | | | | |
| **ජාතික ළමා ආරක්ෂක අධිකාරිය** | | | | | |
| ගොඩනැගිලි | 136,375,875.00 | 1,901,688.00 | - | - | 138,277,563.00 |
| මෝටර් රථ | 48,445,000.00 | - | - | - | 48,445,000.00 |
| ගෘහ භාණ්ඩ | 19,372,781.37 | - | (35,271.00) | - | 19,337,510.37 |
| උපකරණ | 64,548,204.02 | 5,866,780.93 | (410,075.20) | - | 70,004,909.75 |
| | **268,741,860.39** | **7,768,468.93** | **(445,346.20)** | - | **276,064,983.12** |
| **ව්‍යාපෘතිවලින් ලත් ස්ථාවර වත්කම්** | | | | | |
| පුනරුත්ථාපන ව්‍යාපෘතිය -ගෘහභාණ්ඩ | 501,446.00 | - | - | - | 501,446.00 |
| ILO - ළමා ජාවාරම් වැළැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 754,701.00 | - | - | - | 754,701.00 |
| ILO - පර්යේෂණ ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 6,969.00 | - | - | - | 6,969.00 |
| සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 2,232,158.65 | - | - | - | 2,232,158.65 |
| සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 1,035,193.00 | - | - | - | 1,035,193.00 |
| චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 96,275.00 | - | - | - | 96,275.00 |
| PCN ව්‍යාපෘතිය - පරිගණක | 736,632.89 | - | (439,555.00) | - | 297,077.89 |
| SAIEVAC ව්‍යාපෘතිය | | | | | |
| - ගෘහභාණ්ඩ | 79,147.50 | - | - | - | 79,147.50 |
| - උපකරණ | 85,757.00 | - | (3,490.00) | - | 82,267.00 |
| UNDP ව්‍යාපෘතිය | | | | | |
| - ගෘහභාණ්ඩ | 33,112.80 | - | - | - | 33,112.80 |
| - උපකරණ | 1,782,665.28 | - | - | - | 1,782,665.28 |
| UNICEF ව්‍යාපෘතිය | | | | | |
| - මෝටර් රථ | 8,378,609.00 | - | - | - | 8,378,609.00 |
| - උපකරණ | 11,028,244.68 | - | - | - | 11,028,244.68 |
| GIZ - මෝටර් රථ | 2,113,000.00 | - | - | - | 2,113,000.00 |
| SAVE THE CHILDREN - උපකරණ | 133,980.00 | - | - | - | 133,980.00 |
| | **28,997,891.80** | - | **(443,045.00)** | - | **28,554,846.80** |
| **එකතුව** | **297,739,752.19** | **7,768,468.93** | **(888,391.20)** | - | **304,619,829.92** |

| සටහන 8 කවදුරටත් | | | | | රු. |
|---|---|---|---|---|---|
| **ක්ෂය වෙන් කිරීම** | **2024.01.01 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | **2024 වසර සඳහා ක්ෂය ප්‍රතිපාදන** | **ඉවත්කිරීම** | **පූර්ව වර්ෂයේ ගැලපීම** | **2024 .12.31දිනට පහළට ගෙනා ශේෂය** |
| **ජාතික ළමා ආරක්ෂක අධිකාරිය** | | | | | |
| ගොඩනැගිලි | 2,727,517.50 | 2,727,517.50 | - | | 5,455,035.00 |
| මෝටර්රථ | 21,349,666.00 | 4,089,500.00 | - | | 25,439,166.00 |
| ගෘහභාණ්ඩ | 15,738,787.50 | 799,623.99 | (34,958.25) | - | 16,503,453.24 |
| උපකරණ | 55,156,080.28 | 4,223,243.17 | (331,292.68) | - | 59,048,030.77 |
| | **94,972,051.28** | **11,839,884.66** | **(366,250.93)** | - | **106,445,685.01** |
| **ව්‍යාපෘතිවලින් ලත් ස්ථාවර වත්කම්** | | | | | |
| පුනරුත්ථාපන ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ | 501,446.00 | - | - | - | 501,446.00 |
| ILO ළමා ශ්‍රමය වැලැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ | 754,701.00 | - | - | - | 754,701.00 |
| ILO පර්යේෂණ ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ | 6,969.00 | - | - | - | 6,969.00 |
| සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ | 2,232,158.65 | - | - | - | 2,232,158.65 |
| සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ | 1,035,193.00 | - | - | - | 1,035,193.00 |
| චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ | 96,275.00 | - | - | - | 96,275.00 |
| PCN ව්‍යාපෘතිය - පරිගණක | 736,632.89 | - | (439,555.00) | - | 297,077.89 |
| SAIEVAC ව්‍යාපෘතිය | | | | | |
| - ගෘහ භාණ්ඩ | 79,147.50 | - | - | - | 79,147.50 |
| - උපකරණ | 84,507.00 | 750.00 | (3,490.00) | - | 81,767.00 |
| UNDP ව්‍යාපෘතිය | | | | | |
| -ගෘහ භාණ්ඩ | 33,112.80 | - | - | - | 33,112.80 |
| - උපකරණ | 534,799.58 | 267,399.79 | - | - | 802,199.37 |
| UNICEF ව්‍යාපෘතිය | | | | | |
| - මෝටර්රථ | 3,687,909.00 | 660,300.00 | - | - | 4,348,209.00 |
| - උපකරණ | 9,280,485.22 | 665,900.00 | - | - | 9,946,385.22 |
| GIZ - මෝටර්රථ | 2,113,000.00 | - | - | - | 2,113,000.00 |
| SAVE THE CHILDREN - උපකරණ | 71,931.89 | 20,097.00 | - | - | 92,028.89 |
| | **21,248,268.53** | **1,614,446.79** | **(443,045.00)** | - | **22,419,670.32** |
| **එකතුව** | **116,220,319.81** | **13,454,331.45** | **(809,295.93)** | - | **128,865,355.33** |

| සටහන 8කවදුරටත්. | | | රු. |
|---|---|---|---|
| ශුද්ධ පොත් අගයන් | පිරිවැය | සමුච්චිත ක්ෂය | ශුද්ධ පොත් අගය |
| **ජාතික ළමා ආරක්ෂක අධිකාරිය** | | | |
| ගොඩනැගිලි | 138,277,563.00 | 5,455,035.00 | 132,822,528.00 |
| මෝටර්රථ | 48,445,000.00 | 25,439,166.00 | 23,005,834.00 |
| ගෘහභාණ්ඩ | 19,337,510.37 | 16,503,453.24 | 2,834,057.13 |
| උපකරණ | 70,004,909.75 | 59,048,030.77 | 10,956,878.98 |
| | **276,064,983.12** | **106,445,685.01** | **169,619,298.11** |
| **ව්‍යාපෘති වලින් ලත් ස්ථාවර වත්කම්** | | | |
| පුනරුත්ථාපන ව්‍යාපෘතිය -ගෘහ භාණ්ඩ | 501,446.00 | 501,446.00 | - |
| ILO ළමා ශ්‍රමය වැලැක්වීමේ ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ | 754,701.00 | 754,701.00 | - |
| ILO පර්යේෂණ ව්‍යාපෘතිය - ගෘහභාණ්ඩ | 6,969.00 | 6,969.00 | - |
| සුනාමි පරිත්‍යාග ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 2,232,158.65 | 2,232,158.65 | - |
| සුනාමි පුහුණු ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 1,035,193.00 | 1,035,193.00 | - |
| චර්යා පද්ධති ව්‍යාපෘතිය - ගෘහ භාණ්ඩ | 96,275.00 | 96,275.00 | - |
| PCN ව්‍යාපෘතිය - පරිගණක | 297,077.89 | 297,077.89 | - |
| SAIEVAC ව්‍යාපෘතිය | | | |
| - ගෘහභාණ්ඩ | 79,147.50 | 79,147.50 | - |
| - උපකරණ | 82,267.00 | 81,767.00 | 500.00 |
| UNDP ව්‍යාපෘතිය | | | |
| - ගෘහභාණ්ඩ | 33,112.80 | 33,112.80 | - |
| - උපකරණ | 1,782,665.28 | 802,199.37 | 980,465.91 |
| UNICEF ව්‍යාපෘතිය | | | |
| - මෝටර් රථ | 8,378,609.00 | 4,348,209.00 | 4,030,400.00 |
| - උපකරණ | 11,028,244.68 | 9,946,385.22 | 1,081,859.46 |
| GIZ - මෝටර් රථ | 2,113,000.00 | 2,113,000.00 | - |
| SAVE THE CHILDREN - උපකරණ | 133,980.00 | 92,028.89 | 41,951.11 |
| | **28,554,846.80** | **22,419,670.32** | **6,135,176.48** |
| **එකතුව** | **304,619,829.92** | **128,865,355.33** | **175,754,474.59** |

| සටහන 8.1 | | | | | | රු. |
|---|---|---|---|---|---|---|
| කල්බදු දේපළ | කල් බදු කාල පරිච්ඡේදය (වර්ෂ) | බදු පිරිවැය | පසුගිය වර්ෂය සඳහා සමුච්චිත ක්‍රමක්ෂය | ඉදිරියට ගෙනා ශේෂය | 2024 වර්ෂය සඳහා ක්‍රමක්ෂය වෙන් කිරීම් | පහළට ගෙනා ශේෂය |
| කල්බදු දේපළ )2000) | 50 | 8,422,459.89 | 4,042,780.76 | 4,379,679.13 | 168,449.20 | **4,211,229.93** |
| කල්බදු දේපළ )2016) | 30 | 18,317,757.08 | 4,884,735.20 | 13,433,021.88 | 610,591.90 | **12,822,429.98** |
| | | **26,740,216.97** | **8,927,515.96** | **17,812,701.01** | **779,041.10** | **17,033,659.91** |

| සටහන 9 | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **දිගු කාලීන ලැබීම්** | | |
| ආපදා ණය | 2,782,677.59 | 2,425,739.83 |
| එකතුව | **2,782,677.59** | **2,425,739.83** |

| සටහන 10 | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **ආයෝජන සහ ඉතිරි කිරීම** | | |
| පාරිතෝෂික අරමුදල් ආයෝජන ගිණුම -261605 | 1,544,734.42 | 476,574.23 |
| සුනාමි ඉතුරුම් ගිණුම -679016 | 32,243.41 | 64,004.18 |
| ආපදා ණය ඉතුරුම් ගිණුම 8994555 -4 | 284,641.94 | 541,534.89 |
| ස්ථාවර තැන්පතු | 8,787,945.44 | 8,265,387.95 |
| **එකතුව** | **10,649,565.21** | **9,347,501.25** |

| සටහන 11 | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **ලැබිය යුතු ගිණුම්** | | |
| උත්සව අත්තිකාරම් | 168,950.00 | 135,250.00 |
| මුදල් අත්තිකාරම් | 505,490.94 | 1,558,700.05 |
| ලැබිය යුතු ගිණුම් | 23,976.26 | 162,681.00 |
| ලැබිය යුතු ආපදා ණය | 1,025,581.72 | 714,569.53 |
| ලැබිය යුතු - ළමා ආරක්ෂක අරමුදල | - | 410,413.00 |
| **එකතුව** | **1,723,998.92** | **2,981,613.58** |

| සටහන 12 | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **පූර්ව ගෙවීම්** | | |
| රක්ෂණය | 152,692.74 | 137,110.20 |
| සේවා ගිවිසුම | 343,611.97 | 255,682.65 |
| **එකතුව** | **496,304.71** | **392,792.85** |

| | | රු. | රු. |
|---|---|---|---|
| **සටහන 13** | 2024 | **2023** |
| **මුදල් සහ මුදල් සමාන දෑ** | | |
| ලංකා බැංකුව -ජංගම ගිණුම 228076 | 7,577,346.86 | 3,019,423.97 |
| - ජංගම ගිණුම 71252941 | 690,116.96 | 504,848.14 |
| මහජන බැංකුව -ජංගම ගිණුම 174-1-001-4-0347385 | 71,524.74 | 160,524.74 |
| **එකතුව** | **8,338,988.56** | **3,684,796.85** |

සටහන - 14 A

ව්‍යාපෘති අරමුදල් ශේෂ -විස්තරය

රු.

| ව්‍යාපෘතියේ නම | ඉදිරියට ගෙනා ශේෂය | පූර්ව වර්ෂයේ ගැලපීම් | 2024 | | පහළට ගෙනා ශේෂය |
|---|---|---|---|---|---|
| | | | අරමුදල්/ලැබීම් | වියදම් | |
| සුනාමි අනුග්‍රාහකත්වය - Daily Mirror | 160,524.74 | - | 24,000.00 | (113,000.00) | 71,524.74 |
| Child Fund | 504,300.53 | - | - | - | 504,300.53 |
| මහජන බැංකුව | - | - | 500,000.00 | - | 500,000.00 |
| UNICEF අරමුදල | 212,250.00 | - | 4,814,815.20 | (5,027,065.20) | - |
| **එකතුව** | **877,075.27** | **-** | **5,338,815.20** | **(5,140,065.20)** | **1,075,825.27** |

**NOTE -14 B**

**ළමා ආරක්ෂක අරමුදල -ගිණුම්**

**සාරාංශය**

රු.

| අරමුදලේ නම | ඉදිරියට ගෙනා ශේෂය | පූර්ව වර්ෂය | ලැබීම් (සටහන1 -C) | වියදම් (සටහන 12) | අතිරික්තය /හිඟය (2024 වසර සඳහා) | පහළට ගෙනා ශේෂය |
|---|---|---|---|---|---|---|
| ළමා ආරක්ෂක අරමුදල | 1,693,044.44 | - | 193,065.74 | (93,000.00) | 100,065.74 | 1,793,110.18 |

| සටහන 15 | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **උපචිත වියදම්** | | |
| අතිකාල | 192,479.89 | 178,989.40 |
| ආරක්ෂක සේවා | 217,841.52 | 434,523.73 |
| සනිපාරක්ෂක සේවා | 215,641.16 | 174,526.60 |
| සේවක අර්ථ සාධක අරමුදල | 478,293.00 | 478,293.00 |
| සේවක භාරකාර අරමුදල | 71,743.95 | 71,743.95 |
| ගමන් වියදම් සහ සංයුක්ත දීමනා | 608,725.00 | 661,650.91 |
| විදුලි වියදම් | 384,923.69 | 502,960.69 |
| ජලය | 5,099.12 | 7,263.02 |
| ලිපි ද්‍රව්‍ය | 100,000.00 | - |
| ළමා ආරක්ෂක අරමුදලෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ගෙවීම් | - | 410,413.00 |
| දුරකථන වියදම් | 496,500.34 | 429,741.98 |
| විවිධ ණය හිමියෝ | 1,091,736.10 | 2,600,427.14 |
| වෙබ් අඩවි නඩත්තුව | 27,200.64 | 27,024.96 |
| පුවත්පත් වියදම් | 21,250.00 | 28,790.00 |
| නිවාඩු දින ගෙවීම් | - | 2,564.25 |
| ආධුනිකයන් පුහුණු කිරීම සඳහා දීමනා | 95,000.00 | 73,750.00 |
| බදු ගෙවීම | 835,470.95 | 1,469,990.32 |
| ගෙවිය යුතු වැටුප් | 641,358.62 | 1,176,458.62 |
| **එකතුව** | **5,483,263.98** | **8,729,111.57** |

| සටහන 16 | රු. 2024 | රු. 2023 |
|---|---|---|
| **කෙටි කාලීන වෙන් කිරීම්** | | |
| විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් | 500,000.00 | 476,100.00 |
| කෙටි කාලීන පාරිතෝෂිත අරමුදල් සඳහා වෙන් කිරීම් | 2,207,222.50 | 474,793.50 |
| **එකතුව** | **2,707,222.50** | **950,893.50** |

| | | | | | රු. |
|---|---|---|---|---|---|
| සටහන 17 | **20241/1/ දිනට ඉදිරියට ගෙනා ශේෂය** | 2024 වසර සඳහා ලැබීම් | 2024 සඳහා වියදම් | පූර්ව වර්ෂයේ ගැලපීම් | 2024/12/31 දිනට පහළට ගෙනා ශේෂය |
| **යෙදවූ ප්‍රාග්ධනය** | | | | | |
| **ප්‍රාග්ධන ප්‍රදාන** | | | | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 13,065,607.71 | 166,920.00 | (3,155,555.65) | - | 10,076,972.06 |
| UNICEF - ප්‍රදාන | 1,861,159.46 | - | (722,600.00) | - | 1,138,559.46 |
| UNDP - ප්‍රාග්ධන ප්‍රදාන | 1,247,865.70 | - | (267,399.79) | - | 980,465.91 |
| ප්‍රාග්ධන ප්‍රදාන - වත්කම් අත්පත් කර ගැනීමේ/සංවර්ධනය කිරීමේ කටයුතු | 3,300.50 | - | (3,300.50) | - | - |
| ප්‍රාග්ධන ප්‍රදාන -කල්බදු දේපළ | 13,433,021.87 | - | (610,591.90) | - | 12,822,429.97 |
| SAVE THE CHILDREN - ප්‍රාග්ධන ප්‍රදාන | 62,048.11 | - | (20,097.00) | - | 41,951.11 |
| අමාත්‍යාංශ ප්‍රදාන (ප්‍රාග්ධන අත්පත් කර ගැනීම්) | 2,187,770.83 | 5,699,860.93 | (2,201,816.56) | - | 5,685,815.20 |
| ජනාධිපති කාර්යාලය විසින් ලබාදුන් මෝටර් රථ | 4,524,167.00 | - | (610,000.00) | - | 3,914,167.00 |
| ප්‍රාග්ධන ප්‍රදාන - ICTA | 2,131,307.14 | - | (339,212.40) | - | 1,792,094.73 |
| **එකතුව** | **38,516,248.32** | **5,866,780.93** | **(7,930,573.80)** | **-** | **36,452,455.44** |

මගේ අංකය / எனது இல. / My No. } VOT/B/NCPA/01/2024/03    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2025 මැයි 20 දින

සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 49 ඡේදය අනුව දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේදී එම වත්කම අදාල වන වත්කම් පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතුය. එහෙත් අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.58,936,609 ක් වූ මෝටර් රථ වත්කම් පන්තිය තුළ ඇතුළත් මෝටර්රථ 47 න් මෝටර්රථ 09 ක් 2021 වර්ෂයේ ප්‍රත්‍යාගණිත වටිනාකම මත සහ ඉතිරි වාහන 38 පිරිවැයට ගිණුම්ගතකර තිබුණි. තවද ලීබඩු සහ උපකරණ වත්කම් පන්ති දෙකෙහි සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ වත්කම් අයිතමයන් පමණක් 2019 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය අනුව දේපල, පිරියත හා උපකරණවල අවශේෂ වටිනාකම හා ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුවත් අධිකාරියේ සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ධාරණ අගය ශුන්‍ය වූ පිරිවැය/ ප්‍රත්‍යාගණිත වටිනාකම රු.77,290,013 ක් වූ දේපල, පිරියත හා උපකරණ අයිතම 2,456 ක ප්‍රයෝජනවත් ජීවිත කාලය නිවැරදිව සමාලෝචනය නොකිරීම හේතුවෙන් තවදුරටත් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08හි 19 ඡේදයට පටහැනිව ගෙවීම අවිනිශ්චිතව පැවති හිඟ වැටුප් ගෙවීමක් සඳහා රු.641,358ක් ගෙවිය යුතු වැටුප් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08හි 100 ඡේදය අනුව වාර්තා කරන දිනට ඇති සෑම අසම්භාව්‍ය වගකීම් පන්තියක් සඳහාම අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් අධිකාරියේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට විභාග වෙමින් පවතින නඩු කටයුතු තුනක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම කර නොතිබුණි. එමෙන්ම ප්‍රමිතයෙහි 22 වගන්තිය අනුව එම කටයුතු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදුවන නීතිඥ ගාස්තු සඳහා ද වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09හි 15 ඡේදය අනුව පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට තොග මැනීම සිදු කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 05 යටතේ තොග සාමාන්‍ය පිරිවැය ක්‍රමයට (average cost) අගය කරන බව දක්වා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11හි 12 හා 93 ඡේද අනුව හුවමාරු නොවන ගනුදෙනු ලෙස වාර්තාකරණ අස්ථිත්වයට ලැබුණු ත්‍යාග සහ ප්‍රදානයන් සියල්ල ආදායම් ලෙස හඳුනාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හා ව්‍යාපෘති ප්‍රදාන ලෙස ලැබී තිබුණු එකතුව රු.11,398,662ක් ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි. තවදුරටත් රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කරමින් පැවති අතර 2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය ලෙස රු.36,452,455 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 14 හි 21,22 හා 23 ඡේද අනුව රු.2,364,438 ක් වූ අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19හි 76 හා 77 ඡේද අනුව සේවක ප්‍රතිලාභ හඳුනාගැනීම හා මැනීම යටතේ ප්‍රමිතයේ සඳහන් උපලේඛන පදනම් කරගනිමින් පශ්චාත් සේවක ප්‍රතිලාභ හා බැඳියාවන් වර්තමාන අගයට මැනිය යුතු වුවත් අධිකාරිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.91,098,000ක් වූ පාරිතෝෂිත වෙන්කිරීම් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 17,26 හා 118 ඡේද අනුව පරිගණක පද්ධති හා පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කළ යුතු වුවත් අධිකාරිය විසින් 2024 ජනවාරි මාසයේදී මිලදීගෙන තිබුණු රු.5,033,718ක් වූ දත්ත පද්ධති 02 හි වටිනාකම උපකරණ යටතේ ඇතුළත් කර තිබුණි. තවද 2017 වර්ෂයේදී ගිණුම්කරණ හා වැටුප් වලට අදාලව රු.473,000 කට මිලදීගෙන තිබූ ගිණුම්කරණ පද්ධතිය, අස්පෘශ්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධනීත කිරීම වෙනුවට අදාල වර්ෂයේ වියදමක් ලෙස කපාහැර තිබුණි. ඒ අනුව අස්පෘශ්‍ය වත්කම් රු.5, 718 ක් හා රඳවාගත් ඉපයීම රු.473,000කින් අඩුවෙන්ද උපකරණ වටිනාකම රු.5, 506,718 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) 2011 වර්ෂයේ සිට විගණිත දින දක්වා පොත් 5000 ක් පමණ පවතින පුස්තකාලයක් අධිකාරිය විසින් පවත්වාගෙන යමින් පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම පුස්තකාලය සඳහා මිලදී ගෙන තිබූ පොත් ජංගම නොවන වත්කම් ලෙස හඳුනාගැනීමකින් තොරව අදාළ වර්ෂයේ වියදම් ලෙස කපා හැර තිබුණි. 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වටිනාකම රු.250,290 ක් වූ පොත් මිලදී ගැනීම් සිදුකර තිබුණි

(ඔ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ප්‍රධාන මඟින් ලද වත්කම්වලට අදාළ ශේෂයක් නොපැවතියදී වත්කම් අයිතම 06කට අදාලව එකතුව රු.6,302,797 ක් සාවද්‍ය ලෙස සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්ත ගිණුමට හර කර ආදායම් ගිණුමට බැර කර තිබුණි. ඒ අනුව වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය හා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඕ) 2023 වර්ෂයේ අධිකාරියට එරෙහිව බාහිර ආයතනයක් විසින් පවරා තිබුණු නඩු කටයුතු 02ක් වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව පැවති නීතිඥ ගාස්තු සඳහා වෙන්කිරීමක් සිදු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් ගෙවීමට සිදුවී තිබුණු රු.228,500ක් වූ නීතිඥ ගාස්තු ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ පුනුණු හා වෙනත් වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා රඳවාගත් ඉපැයුම් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂිත වෙන් කිරීම රු.4,012,402ක් වැඩියෙන් සිදු කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අධිකාරියේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම් එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2.** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාෘකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති/ විධානවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත 1992 මුදල්රෙගුලාසි 371(5) | I. අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුලදී නිකුත් කර තිබූ එකතුව රු.505,491 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පියවීමට කටයුතු කර නොතිබුණි.<br>II. නිලධාරීන්ට ලබාදුන් තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යයට නොයොදා දින 02 සිට දින 69 දක්වා කාල පරාසයක් තුල අත රඳවාගෙන මුළු මුදලම ආපසු පියවා තිබුණු අවස්ථා 09 ක් පැවතුණි. |
| (ආ) | පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 08/2019 (I), 08/ 2019(II) | ශ්‍රී ලංකාව තුළ e-GP ප්‍රසම්පාදන ක්‍රියාවලිය හඳුන්වා දීමට අදාලව 2020 ජනවාරි 31 දිනට පෙර සෑම රජයේ ආයතනයක්ම e-GP ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ලියාපදිංචි වී එම පද්ධතිය හරහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතු වුවද අධිකාරිය විසින් විගණිත දිනය වූ 2025 මැයි 16 දින දක්වාම ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍ය හා කාර්යයන් | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂණ අධිකාරී පනත | |
| I. 14(අ) හා (ඊ) වගන්ති | ළමා අපචාර වැළැක්වීම හා එවැනි අපචාරවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර එය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අධිකාරියේ මූලික අරමුණ විය. එහෙත් අදාල ජාතික ප්‍රතිපත්තිය සකස් කර අනුමත කර ගැනීම සඳහා අධිකාරිය ආරම්භ කළ දිනයේ සිට වසර 21 ක් ගත වී තිබුණු අතර එම අනුමත කළ දිනය වූ 2019 ඔක්තෝබර් 29 වන දින සිට විගණිත දිනය වූ 2025 මැයි 16 දිනට වසර 5 ක් ගත වී තිබුණද ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පස් අවුරුදු සැලැස්ම සකස් කර අනුමත කර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. |
| II. 14(ක) වගන්තිය | අධිකාරිය පිහිටුවා වසර 26 කට අධික කාලයක් ගත වී තිබුණද අධිකාරියේ මූලික අරමුණක්ව පවතින ජාතික දත්ත පද්ධතියක් සකස් කර එය පවත්වා ගැනීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් 14(උ), (ඌ) හා (ජ) වගන්ති අනුව ළමා අපචාර වලට අදාල නීති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නියාමනය කිරීම හා ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාව බලාපොරොත්තු වන තොරතුරු සැපයීමට නොහැකි වී තිබුණි. |

| | |
|---|---|
| III. 14(ඉ),(උ), (ඌ), (ඒ), (ඔ) | 2014 වර්ෂයේ සිට 2025 අප්‍රේල් 30 දින දක්වා අධිකාරිය වෙත ළමා අපචාර සම්බන්ධයෙන් පැමිණිලි 107,663 ක් ලැබී තිබුණු අතර එයින් පැමිණිලි 46,813 ක් එනම් සියයට 43 ක ප්‍රමාණයක් තවදුරටත් විමර්ශණය කරමින් පැවතුණි. ඒ අනුව ළමා අපචාර වලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ රැකවරණය සලසා සියළු ආකාර ළමා අපචාර වලට අදාල නීති ක්‍රියාත්මක කිරීම, නියාමනය, සියලු විමර්ශන නඩු කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය, අපචාර පිළිබඳ පැමිණිලි භාරගැනීම හා නීති බලධාරීන් වෙත යොමු කිරීම වැනි අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු කිරීමට නොහැකි වී තිබුණි. |
| IV. 14(ඈ), 14(ජ) | අපචාර වලින් ආරක්ෂා කරනු ලැබීම, ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳව හා ළමා අපචාර වළක්වා ගැනීමේ ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම හා ළමයින්ගේ සුරක්ෂිතභාවය, ළමයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම අධිකාරියේ අරමුණු අතර විය. ඒ අනුව අධිකාරිය විසින් පාසැල් ලියාපදිංචි කර ගැනීම හා වැඩසටහන් පැවැත්වීමේ ජාතික වැඩසටහන 2022 වර්ෂයේදී ආරම්භ කර තිබුණද 2025 අප්‍රේල් 15 දින වන විට පාසැල් 1,396 ක් පමණක් ලියාපදිංචි කර ගෙන තිබුණු අතර 2023 හා 2024 වර්ෂ වල දිස්ත්‍රික් ශිෂ්‍ය තානාපති වැඩ සටහන් 46 ක් හා දිස්ත්‍රික් තානාපති සමුළු 24 ක් පමණක් පවත්වා තිබුණි. |

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) 2021 ජුලි 12 දිනැති අංක අමප/21/1131/308/097 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අපයෝජනයට ලක් වූ ළමුන් විසින් ලබාදෙන සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සඳහා ඒකක 09 ක් පළාත් මට්ටමින් ස්ථාපිත කිරීමට අනුමත කර 2025 මැයි 16 දිනවන විට වර්ෂ 04කට ආසන්න කාලයක් ගත වී තිබුණද ඒකක 07ක් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. කොළඹ ප්‍රධාන කාර්යාලයේ හා රාගම රෝහලේ ඒකක 02 ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර එම ඒකක දෙකෙහි 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී සාක්ෂි වීඩියෝ පටිගත කිරීම් 205ක් සිදුකර තිබුණි.

(ආ) ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලි වලට අදාල නඩු කටයුතු වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කිරීම සඳහා සැලැස්මක් සකස් කර මාස 03 ක් තුල ක්‍රියාත්මක කළ යුතු බවට තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව විසින් 2024 අප්‍රේල් 17 දින නියෝගයක් ලබා දී තිබුණද 2025 මැයි 16 දින දක්වාම නඩු කටයුතු වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ පළමු උපලේඛනයට යටත් වන අක්‍රමිකතාවලට අදාලව 2010 මැයි 21 දිනැති අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාවේ පවරා තිබුණු නඩුවකට අනුව 2010 අගෝස්තු 25 දින වැඩ තහනම් වූ ගණකාධිකාරිවරිය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 27.11 වගන්තිය අනුව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා විනය නියෝග නිකුත් කිරීමට වසර 11ක් ගතකර තිබුණි. තවද එම නඩුවේ තීන්දුව අනුව අදාල නිලධාරිණිය නිදොස් කොට නිදහස් කර නොතිබියදී මුදල් අමාත්‍යාංශ නියෝජිතයා සහභාගී නොවූ 2022 මැයි 26 දිනැති 214 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අදාල නිලධාරිණියට රු.8,374,383ක් වූ හිඟ වැටුප් ගෙවීමට තීරණය කර තිබූ අතර 2023 මැයි 31 දින වනවිට එයින් රු.7,270,402ක් ගෙවීම් කර තිබුණි.

(ඈ) අධිකාරියේ අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර සඳහා බඳවාගැනීම් සිදුකිරීමේදී අධිකාරිය සඳහා අනුමත බඳවාගැනීමේ පටිපාටියට අනුව අනුමත උපාධිය සමඟ පශ්චාත් උපාධිය සහ අවම වශයෙන් වසර 12ක පළපුරුද්දක් ලබා තිබිය යුතු වුවත් අදාල සුදුසුකම් සම්පූර්ණ කර නොතිබූ හා අක්‍රමිකතාවයට චෝදනා ලත් නිලධාරිණියක් 2024 අගෝස්තු 15 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් තෝරාගෙන තිබුණි.

(ඉ) එවකට පැවති ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් මුලතිව් දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී රු.23,420,000ක් වැය කර ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වෙත වාචිකව පවරා තිබුණු ගොඩනැගිල්ල වසර 10 කට අධික කාලයක සිට නීත්‍යානුකූලව පවරා ගැනීමට හා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ට) ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය විසින් 2016 වර්ෂයේදී වසර 30 ක බදු පදනම මත එකවර රු.18,317,757 ක් ගෙවා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මාදිවෙල ප්‍රදේශයේ ඉඩමක් ලබාගෙන වසර 08 කට අධික කාලයක් ගත වී තිබුණද වාර්තාවේ දිනය දක්වාම එම ඉඩම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි..

(ඨ) අවම මූලික සුදුසුකම් නොමැති අනුමත බඳවාගැනීමේ පටිපාටියට පටහැනි ලෙස බඳවාගෙන තිබුණු නිළධාරීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් ද පෙන්වා දී තිබියදීත් විගණිත දිනය වූ 2025 මැයි 16 දින දක්වාම කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ.)